# රාත්‍රී සමාජ ශාලා ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ නූතන ප්‍රවණතා

හද්‍රානි සේනානායක

තමර දර්ශන

පර්යේෂණ අංශය
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
ආරක්ෂක අමාත්‍යාංශය
383, කෝට්ටේ පාර, රාජගිරිය

දූරකථන : 0112 868794 - 6 ෆැක්ස් : 0112 868791 - 2
ක්ෂණික ඇමතුම් 1984 (පැය 24 පුරා)/0112 077 778
වෙබ් : **www.nddcb.gov.lk**
ඊමේල් : **mail@nddcb.gov.lk**

## පටුන

01 වන පරිච්ඡේදය ........................................ 1

හැඳින්වීම ........................................ 1

1.1.අධ්‍යයන පසුබිම ........................................ 1

1.2.පර්යේෂණ ගැටලුව ........................................ 2

1.3. පර්යේෂණ අරමුණු ........................................ 3

1.4. පර්යේෂණ ප්‍රශ්න........................................ 3

1.5. පර්යේෂණ සාධාරණීකරණය හා උපයෝගීතාව ........................................ 3

1.6. පර්යේෂණ ක්‍රමවේදය ........................................ 4

1.7. අධ්‍යයන ක්ෂේත්‍රය ........................................ 5

1.8. අධ්‍යයන නියැදිය........................................ 5

1.9. දත්ත රැස් කිරීම........................................ 5

1.10. දත්ත විශ්ලේෂණය ........................................ 7

02 වන පරිච්ඡේදය ........................................ 8

රාත්‍රී සමාජශාලා ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය හා කාලීන ප්‍රවණතා........................................ 8

(දේශීය හා ගෝලීය සන්ධර්භය ඇසුරින්) ........................................ 8

2.1 සමාජශාලා මත්ද්‍රව්‍ය (club drugs/ party drugs/ dance drugs) පිළිබඳ පාරිභාෂිතය ........................................ 8

2.2 ගෝලීය සන්ධර්භය තුළ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය........................................ 9

2.3 ශ්‍රී ලංකාවේ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය හා ප්‍රවණතාවය........................................ 10

2.4 සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ ලක්ෂණ හා චර්යාත්මක ස්වභාවය ........................................ 12

2.5 සමාජශාලා මත්ද්‍රව්‍ය (Club drugs) භාවිතයට යොමුවීමේ බලපෑම් සහගත සාධක ........................................ 13

2.6 සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිතයේ බලපෑම ........................................ 14

03 වන පරිච්ඡේදය ........................................ 15

අධ්‍යයන ප්‍රතිඵල හා සාකච්ඡාව........................................ 15

3.1. ප්‍රතිචාරකයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ ........................................ 15

3.1.1. ස්ත්‍රී පුරුෂ සංයුතිය ........................................ 15

3.1.2.වයස් මට්ටම ........................................ 15

3.1.3.පදිංචි ප්‍රදේශ අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය ........................................ 16

3.1.4.ජනවර්ගය සහ ආගම අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය ........................................ 17

3.1.5.අධ්‍යාපන මට්ටම අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය........................................ 17

3.1.6.විවාහක අවිවාහක බව ........................................ 18

3.1.7.ආදායම් මාර්ග සහ මාසික ආදායම අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය........................................ 18

3.2. රාත්‍රි සමාජශාලා සාදවලට සහභාගී වන පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ රටාවන් ........................ 19
3.2.1. මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ වයස් මට්ටම ........................ 20
3.2.2. ප්‍රථම වරට භාවිත කරන ලද මත්ද්‍රව්‍ය වර්ග (ප්‍රාථමික මත්ද්‍රව්‍ය) ........................ 21
3.2.3.මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුවීමට බලපාන ලද සාධක ........................ 21
3.2.4. රාත්‍රි සමාජශාලාවල භාවිත කරන මත්ද්‍රව්‍ය වර්ග ........................ 22
3.2.5. රාත්‍රී සමාජශාලා සාද වලදී භාවිත කිරීමට ප්‍රියකරන මත්ද්‍රව්‍ය වර්ග ........................ 28
3.3 රාත්‍රී සමාජශාලා සාදවල මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත පුද්ගල චර්යාවේ ස්වාභාවය ........................ 30
3.3.1. සමාජශාලා සාද වලට යොමුවීම හා සහභාගීත්වය ........................ 30
3.3.2. සමාජශාලා සාද සංවිධානය වන ආකාරය හා මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය කරන ආකාරය ........................ 31
3.4. මත්ද්‍රව්‍ය මිලදීගැනීම සිදුකරන ආකාරය ........................ 35
3.5. මත්ද්‍රව්‍ය භාවිතය : සෞඛ්‍යය හා සමාජ බලපෑම් ........................ 38
3.5.1. මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා ප්‍රතිකාර ලබාගැනීම ........................ 39
3.5.2. සමාජ අපගාමී ක්‍රියාවලට දක්වන දායකත්වය ........................ 39
සාකච්ඡාව ........................ 40
නිගමන ........................ 42
යෝජනා ........................ 44
ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ........................ 45

## 01 වන පරිච්ඡේදය
## හැඳින්වීම

### 1.1.අධ්‍යයන පසුබිම

අන්තරායකර ඖෂධ පාලක මණ්ඩල පනත ප්‍රකාරව මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ ඒ ආශ්‍රිතව මතුවන ආර්ථික, සමාජ, වෛද්‍යමය, නෛතික හා වසංගතමය තත්ත්වයන් පිළිබඳව පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම, පර්යේෂණ අංශය මගින් සිදුකරනු ලබයි. මෙම දිශානතීන් තුළ මත්ද්‍රව්‍ය ආශ්‍රිත විවිධ තේමාවන් හා කාලීන ප්‍රවණතාවයන් හඳුනාගනිමින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ අධ්‍යයන හා සමීක්ෂණවල අනාවරණයන් මත්ද්‍රව්‍ය දුර්භාවිතය පාලනය හා නිවාරණය උදෙසා ක්‍රියාත්මක වන යාන්ත්‍රණය සක්‍රීය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවරයන් සඳහා නිර්දේශ ලෙස ඉදිරිපත් කරනු ලබයි.

පුළුල් වර්ගීකරණයකට ලක් කළ හැකි මත්ද්‍රව්‍ය විෂය තුළ ප්‍රකටව හඳුනාගත හැකි සහ නිලීන ප්‍රවණතාවයන් කාලීනව උද්ගතවෙමින් පවතියි. මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ දත්ත විශ්ලේෂණය කිරීමේ දී කාලානුරූපිව අන්තරායකර ඖෂධ අතුරින් හෙරොයින් හා ගංජා සම්බන්ධ ඉහළප්‍රවණතාවයක් හා ව්‍යාප්තියක් හඳුනාගත හැකි අතර ඊට අමතරව ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය හා වෙනත් වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරනඖෂධ පෙති වර්ග අවභාවිත කිරීම් සම්බන්ධ ප්‍රවණතාවයන් ද නිර්මාණය වෙමින් පවතින බවතහවුරු වෙයි.නීතිය ක්‍රියාත්මක කරන අංශවල වාර්තා වලට අනුව මෙවැනි මත්ද්‍රව්‍ය විශේෂයන්වල ව්‍යාප්තිය ගංජා සහ හෙරොයින් ව්‍යාප්තිය තරම් නොවූවද මේ තුළ හඳුනාගතහැකි අවදානම් සහගත තත්ත්ව රාශියක් ඇත.

ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ගෝලීය මට්ටමේ ඉහළ ප්‍රවණතාවයක් පවතින බවට ලෝක මත්ද්‍රව්‍ය වාර්තාව ඇතුළු සංඛ්‍යාලේඛන සාක්ෂි දරන අතර ඒ සම්බන්ධ කලාපීය මට්ටමින් ද පුළුල් කතිකාවන් සහ නෛතික ක්‍රියාමාර්ග පුළුල් කිරීම සිදුවෙමින් පවතී. අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලයේ (INCB)2016 වාර්ෂික වාර්තාවට අනුව දකුණු ආසියාතික කලාපය විශේෂයෙන් මියන්මාරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශය තුළ ඇම්පිටමින් වර්ගයේ පෙතිවර්ග ජාවාරම ඉහළ ගොස් ඇති බවට වාර්තා වෙයි.

ලංකාව තුළ ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ යම් යම් සිද්ධීන් පසුගිය අවුරුදු කිහිපය තුළ වාර්තාවී ඇති නමුත් ඒ සම්බන්ධයෙන් පැහැදිලි අනාවරණයක් සහිත අධ්‍යයනයක් හෝ පර්යේෂණයක් මේ වනවිට ක්‍රියාත්මක කර නැත. මත්ද්‍රව්‍ය ආශ්‍රිත පර්යේෂණ ක්ෂේත්‍රය තුළ අන්තරායකර ඖෂධ අවභාවිතය පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යයන සිදුවී ඇති නමුත් මෙවැනි ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය හෝ වෛද්‍යමය අරමුණු වලට අදාළ ඖෂධ අවභාවිතය පිළිබඳ ප්‍රමාණවත් දත්ත වාර්තා ප්‍රකාශයට පත්වී නොමැත. එමෙන්ම පොදුවේ රාත්‍රී සමාජශාලා හෝ වෙරළ සාද වැනි පරිශ්‍රවල අවභාවිතවීමක් සිදුවන මත්ද්‍රව්‍ය වර්ග හඳුනාගැනීම සම්බන්ධයෙන්ද පවත්නා මූලාශ්‍ර ප්‍රමාණවත් නොවන නිසා මෙම අධ්‍යයනය තුළඑවැනි මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රධාන අවධානයක් යොමුකරන ලදි.

මෙම ඌණතාවය පූරණය කිරීමේ අරමුණින් පර්යේෂණ අංශය විසින් රාත්‍රී සමාජශාලා සාද සහ වෙරළ සාද(Night club parties & beach parties)ආශ්‍රිතව මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ ප්‍රවණතා හඳුනාගැනීම සඳහා මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කරන ලදී.

ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය හා ඖෂධ වර්ග අවභාවිතය පිළිබඳ අධ්‍යයනය සඳහා රාත්‍රී සමාජශාලා සාද, වෙරළ සාද වැනි සන්දර්භයක් තෝරා ගැනීමෙහි පසුබිම වූයේ දැනට ලංකාවේ පෙතිවර්ග භාවිතය හා ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය භාවිතය එතරම් ප්‍රකටව පෙනෙන ප්‍රවණතාවක් නොවන අතර එවැනි ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය බොහෝවිට රාත්‍රී සමාජශාලා සාද වැනි සමාජ අවස්ථාවන් (Social events)වලට වැඩි වශයෙන් සීමා වී පැවතීමයි. එමෙන්ම රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාද වල වැඩි වශයෙන් මෙවැනි ද්‍රව්‍ය සංසරණය වීම සහ භාවිතය සිදුවන බවට තොරතුරු මාධ්‍ය මඟින් වාර්තා වුවද විද්‍යාත්මක පදනමක් මත සිටඑවැනි අවස්ථාවන් හෝ ප්‍රවණතාවන් පිළිබඳ අධ්‍යයනය සිදුවී නොමැත.

අදාළ අවකාශ තුළභාවිත වන මත්ද්‍රව්‍ය වර්ග, ඒවා භාවිත කරන පුද්ගලයින්ගේ සමාජ ආර්ථික පැතිකඩ හා ඔවුන්ගේ චර්යාවන් වල ස්වභාවය, අදාළ සාද වල මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය හා ඒ සඳහා අභිප්‍රේරණයක් ඇති කිරීම සඳහා නිර්මාණය කරගෙන ඇති උප සංස්කෘතික අගයන් හා ධර්මතාවන්(Sub cultural norms and values)මොනවාද යන්න හඳුනාගැනීමේ මුඛ්‍ය අරමුණු සහිතව මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කර ඇත.

### 1.2.පර්යේෂණ ගැටලුව

රාත්‍රී සමාජශාලා සාද හා වෙරළ සාද ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය හා ප්‍රවණතා මොනවාද? අදාළසන්දර්භ තුළ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත උප සංස්කෘතික චර්යා රටාවල ස්වභාවය සහ ඒ හරහා මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වන්නේ කෙසේද? යන ගැටලු ද්විත්වය අධ්‍යයනය කිරීම සඳහා මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කර ඇත. විශේෂයෙන් මෙවැනි ස්ථාන වල මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් මාධ්‍ය වාර්තා සහ වෙනත් ද්විතියික මාර්ග ඔස්සේ තොරතුරු වාර්තා වුවද ඒවායේ විශ්වසනීයභාවය හා වලංගුභාවය පිළිබඳ ගැටලු මතුවේ. මේ නිසා ඉහත සඳහන් පරිශ්‍ර තුළමත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය හා ප්‍රවණතා මෙන්ම ඒ ආශ්‍රිතව නිර්මාණය වී ඇති උප සංස්කෘතික චර්යා රටා පිළිබඳ විද්‍යාත්මක පදනමකින් අධ්‍යයනය කිරීම මෙහිදී සිදුකර ඇත.

### 1.3. පර්යේෂණ අරමුණු

- ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය හා රාත්‍රී සමාජශාලා වල භාවිත වනමත්ද්‍රව්‍ය (Club drugs)භාවිතයේ ස්වාභාවය සහ ඒ ආශ්‍රිත ප්‍රවණතා හඳුනාගැනීම
- රාත්‍රී සමාජ ශාලා ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ උප සංස්කෘතික සාධක සහපුද්ගල චර්යාවන්වල ස්වභාවය අධ්‍යයනය කිරීම.
- රාත්‍රී සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ (Socio – demographic profile)නිර්ණය කර ගැනීම.
- ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය හා සමාජශාලා වල භාවිතා වන මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් පවත්නා විවිධ මිථ්‍යා මත හඳුනාගැනීම.
- සමාජශාලා මත්ද්‍රව්‍ය සහ අනෙක් නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය වර්ග භාවිතය අතර සබඳතාවයක් පවතින්නේ නම් එය හඳුනාගැනීම.
- ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිතය හා සමාජශාලා ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වැළැක්වීම හා නිවාරණය උදෙසා සුදුසු උපායමාර්ග සකස් කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

### 1.4. පර්යේෂණ ප්‍රශ්න

- රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාද ආශ්‍රිතව භාවිත වන මත්ද්‍රව්‍ය වර්ග, ඒවා භාවිත කරන රටාවන් සහ ඒ ආශ්‍රිත චර්යාවන් වල ස්වාභාවය කෙබඳුද?
- රාත්‍රී සමාජශාලා ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතයේ නව ප්‍රවණතා මොනවාද?
- සමාජශාලා ආශ්‍රිතව මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන උපායමාර්ග මොනවාද?
- ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධව පුද්ගලයින් විසින් නිර්මාණය කරගෙන ඇති මිථ්‍යා විශ්වාස මොනවාද?
- සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ ප්‍රජා සමාජ පැතිකඩ සකස් වී ඇත්තේ කෙසේද?

### 1.5. පර්යේෂණ සාධාරණීකරණය හා උපයෝගීතාව

ලෝකයේ මෙන්ම ලංකාවේ ද බොහෝ ප්‍රධාන නගරවල රාත්‍රී සමාජශාලා කේන්ද්‍ර කරගත් විනෝදකාමී ක්‍රියාකාරකම් මත පදනම් වූ ආර්ථික රටාවන් වර්ධනය වෙමින් පවතින බවට විවිධ අධ්‍යයන හරහා පෙන්වා දී ඇත. එමෙන්ම මෙවැනි රාත්‍රී සමාජශාලා අංගයන් හරහා විවිධ ස්වරූපයේ උප සංස්කෘතික චර්යා රටාවන් සහ සමාජ ජාල නිර්මාණය වී ඇත. විශේෂයෙන් hip-hop (HH) සහ විද්‍යුත් නර්තන සංගීත (EDM- Electronic Dance & Music)වැනි අංගයොදා ගනිමින් තරුණ පිරිස් එවැනි සාද වලට ආකර්ෂණය කරගන්නා අතර ඒ හරහා උප සංස්කෘතියක් ගොඩනගා

ගෙන ඇත. රාත්‍රී සමාජශාලා වල මෙවැනි විශේෂාංග පැවැත්වීම තුළ වෙනම විනෝදකාමී කර්මාන්තයක්(Leisure Industry)බිහිවෙමින් පවතින අතර එය විවිධ සමාජ ගැටලු නිර්මාණය වීමට ද හේතු පාදක වී ඇත. මෙවැනි රාත්‍රී සමාජ ශාලා තුළ අපරාධ චර්යා, මත්ද්‍රව්‍ය අලෙවිය සහ භාවිතය වැනි ක්‍රියා ප්‍රවර්ධනය කරනු ලබන අවස්ථා බහුල වශයෙන් ඇති බවට ද ද්විතියික මූලාශ්‍ර ඔස්සේ සනාථ වී ඇත. බොහෝ සමාජශාලා වලින් තරුණයින් වෙනුවෙන් සහ තරුණයින් ඉලක්ක කර ගනිමින් විවිධ අංග(Events) පිළිගැන්වීම තුළින් ඔවුන් මත්ද්‍රව්‍ය ආශ්‍රිත නීතිවිරෝධී ක්‍රියාකාරකම් වලට පෙළඹවීමක් සිදුවෙමින් පවතී.

තරුණ කණ්ඩායම් අපගාමී ක්‍රියාවන්ට යොමුකරවන මෙවැනි අවස්ථාසම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය තුළයොමුව ඇත්තේ අඩු අවධානයකි. මෙම තත්ත්වය තුළ ඉහත කී ආකාරයේ අවදානම් සහගත ප්‍රවණතා තවදුරටත් අනාගතයේදී වර්ධනය වියහැකි බැවින් මේ පිළිබඳව මත්ද්‍රව්‍ය නිවාරණය හා පාලනය කිරීමේ යාන්ත්‍රණය තුළඅවධානයට ලක්විය යුතුය. ඒ සඳහා ප්‍රමාණවත් සාක්ෂි මත පදනම් වූ කරුණු (Evidence based facts)අත්‍යාවශ්‍ය බැවින් මෙවැනි අධ්‍යයනයක් ක්‍රියාත්මක කිරීම වඩාත් ප්‍රායෝගික හා කාලානුරූපී ක්‍රියාවක් වේ.

අධ්‍යයන අනාවරණ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට සහ නිවාරණ ක්‍රියාකාරකම් බලගැන්වීම සඳහා ඉදිරිපත් කෙරෙන අතර නිවාරණය තුළ නාගරික තරුණ කණ්ඩායම් කෙරෙහි පවත්නා අවධානය පුළුල් කිරීම ද අත්‍යාවශ්‍ය වේ. තවද සෞඛ්‍යමය වශයෙන් හඳුනාගත් අවදානම් සහගත ක්‍රියාවන් ඉලක්ක කර ගනිමින් සෞඛ්‍යය වැඩසටහන් සැලසුම් කිරීමට සහ නීතිය ක්‍රියාත්මක කරන අංශ වලට අවශ්‍ය ඉදිරි සැලසුම් සකස් කිරීමට ද පදනමක් වශයෙන් යොදාගත හැකිය.

### 1.6. පර්යේෂණ ක්‍රමවේදය

රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාද ආශ්‍රිතව ගොඩනැගී ඇති උප සංස්කෘතික චර්යා රටා, එවැනි පරිශ්‍ර තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ සමාජ ආර්ථික පැතිකඩ, ඔවුන්ගේ අත්දැකීම්, එකිනෙකා අතර ගොඩනගාගෙන ඇති සබඳතා ජාල, සහ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත ප්‍රවණතා වැනි ප්‍රපංච වඩාත් ගැඹුරින් අධ්‍යයනය කිරීම සඳහා මෙහිදී ප්‍රපංචවේදීමය පර්යේෂණ ක්‍රමවේදය (Phenomenological research methodology)යොදාගෙන ඇත. එම පර්යේෂණ ක්‍රමවේදය යටතේ පර්යේෂණ ක්‍රමය වශයෙන් සමීක්ෂණ ක්‍රමය(Survey method)සහ ප්‍රත්‍යක්ෂ අධ්‍යයන(Case study method) ක්‍රමය යොදා ගෙන ඇත. පර්යේෂණ ක්‍රම දෙකක් මිශ්‍රිතව යොදා ගැනීම තුළ උක්ත ප්‍රපංච පිළිබඳ ප්‍රමාණාත්මක ආකාරයෙන් මෙන්ම ගුණාත්මක ආකාරයෙන් අධ්‍යයනය කිරීමට අවකාශය සැලසුණු අතර මතුපිටට දෘශ්‍ය නොවන අන්තර්සබඳතා සහ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිතව ගොඩනැගුණු සබඳතා ජාල පිළිබඳව ගැඹුරින් ග්‍රහණය කරගැනීමට අවකාශය සැලසිණි.

### 1.7. අධ්‍යයන ක්ෂේත්‍රය

මෙම අධ්‍යයනයේ ක්ෂේත්‍රය ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික හා උප නාගරික ප්‍රදේශ තෝරාගන්නා ලදී. එහිදී කොළඹ දිස්ත්‍රික්කයේ වෙරළාසන්න ප්‍රදේශ ද අධ්‍යයන ක්ෂේත්‍රයට ඇතුළත් කරගෙන ඇත. කොළඹ දිස්ත්‍රික්කය අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගැනීමට පාදක වූ නිර්ණායක කීපයක් ඇත. එනම්, සංඛ්‍යාලේඛන වලට අනුව ගංජා, හෙරොයින් ඇතුළු අන්තරායකර ඖෂධ වල ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කරනුයේ කොළඹ දිස්ත්‍රික්කය තුළයි. එමෙන්ම ඖෂධමය පෙති වර්ග අවභාවිත කිරීම සම්බන්ධ සිද්ධීන් බහුල වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාදවල ව්‍යාප්තිය පිළිබඳ සැලකීමේදී ද කොළඹ දිස්ත්‍රික්කය තුළ දේශීය මෙන්ම විදේශීය පුද්ගලයින්ට විවෘත වූ සමාජශාලා රැසක් ක්‍රියාත්මක වේ.

ඒ අනුව ඉහළ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය සහ රාත්‍රී සමාජශාලා වැඩි වශයෙන් ස්ථානගත වී පැවතීම හේතුවෙන් කොළඹ දිස්ත්‍රික්කය අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස යොදාගන්නා ලදී.

### 1.8. අධ්‍යයන නියැදිය

සසම්භාවී නොවන නියැදි ක්‍රම අතුරින් (Non Random Sampling technique)ප්‍රධාන වශයෙන් නියැදි ක්‍රම දෙකක් මෙම අධ්‍යයනයේ දත්ත දායකයින් තෝරා ගැනීම සඳහා උපයෝගී කරගෙන ඇත.

- හිමබෝල නියැදි ක්‍රමය (Snowball Sampling)යොදා ගනිමින් තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍රය තුළ රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාද වලට සහභාගී වී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 50 දෙනෙක් අධ්‍යයන නියැදියට ඇතුළත් කරගන්නා ලදී. එහිදී පූර්වයෙන් ගොඩනගාගත් සබඳතා මත සම්බන්ධ කරගත් එක් පුද්ගලයෙක් මාර්ගයෙන් අනෙක් දත්ත දායකයින් අධ්‍යයනයට සම්බන්ධ කරගන්නා ලදී.
- අරමුණු සහගත නියැදි ක්‍රමය (Purposive sampling) භාවිත කරමින් මූලික තොරතුරු සපයන්නන්(Key informants)අධ්‍යයනය සඳහා තෝරාගන්නා ලදී. එහිදී මූලික අධ්‍යයන නියැදියෙන් තෝරාගත් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 05 දෙනෙක්,අදාළ ප්‍රදේශයේ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් 05 දෙනෙක්, ඖෂධහල් හිමියන්/ ඖෂධවේදීන් 02 දෙනෙක්, රාත්‍රී සමාජශාලා වල කළමනාකරීත්වය ඇතුළු සේවකයින් වැනි පාර්ශව අධ්‍යයනයට සම්බන්ධ කරගන්නා ලදී.

### 1.9. දත්ත රැස් කිරීම

ප්‍රපංචවේදීමය පර්යේෂණ ක්‍රමවේදය යටතේ වඩාත් ගැඹුරින් සහ ගුණාත්මක දත්ත රැස් කිරීම සඳහා අධ්‍යයන අරමුණු වලට වඩාත් ගැළපෙන අයුරින් දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම තෝරාගන්නා ලදී. එහිදී ප්‍රධාන වශයෙන් දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම 04ක් පහත පරිදි උපයෝගී කරගන්නා ලදී.

**ව්‍යූහගත ප්‍රශ්නාවලී ශිල්ප ක්‍රමය(Structured Questionnaire)**

දත්ත දායකයින් ලෙස මෙහිදී රාත්‍රී සමාජශාලා වලට සහභාගී වී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් යොදාගත් අතර ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය පිළිබඳව විශ්ලේෂණයේ පහසුව සඳහා පොදු ආකෘතියකට අනුව තොරතුරු ලබාගැනීමට අවශ්‍ය වූ බැවින් ව්‍යූහගත ප්‍රශ්නාවලියක් යොදා ගන්නා ලදී. ඊට අමතරව අදාළපුද්ගලයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ පිළිබඳව අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා ද මෙම ප්‍රශ්නාවලිය යොදාගන්නා ලද අතර මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ සෞඛ්‍යමය පැතිකඩ සහ ප්‍රතිකාර ලබාගැනීම ආදිය පිළිබඳව ද මෙහිදී තොරතුරු ලබාගන්නා ලදී.

**ගැඹුරු සම්මුඛ සාකච්ඡා(Indepth interviews)**

මෙහිදී මූලික තොරතුරු සපයන්නන් වශයෙන් තෝරාගත් පුද්ගලයින් සමඟ ගැඹුරු සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු ලබාගන්නා ලදී. අධ්‍යයන අරමුණු වලට අනුව සකසාගත් තේමාවන් කිහිපයක් ඔස්සේ සම්මුඛ සාකච්ඡාවන් සිදුකරන ලද අතර විශේෂයෙන් අවදානම් සහගත චර්යා, මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම, මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ සබඳතා ජාලය, නූතන සන්නිවේදන තාක්ෂණය මෙම ක්‍රියාවලියට යොදාගන්නා ආකාරය, සමාජශාලා සාද සංවිධානය වන ආකාරය සහ මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වන ආකාරය වැනි අංශ කෙරෙහි මෙහිදී අවධානය යොමුකරන ලදී. පහත මූලික තොරතුරු සපයන්නන්(Key informants) සමඟ සම්මුඛ සාකච්ඡාපවත්වන ලදී.

- රාත්‍රී සමාජශාලා වල අධ්‍යක්ෂවරුන්/ කළමනාකාරවරු
- රාත්‍රී සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්
- සමාජශාලා වල ආරක්ෂක නිලධාරී/ පහළ ශ්‍රේණියේ සේවකයෙක්
- අදාළ ප්‍රදේශයේ පොලිස් නිලධාරීන්
- අදාළ ප්‍රදේශයේ ඖෂධ හලක හිමිකරුවෙක්/ ඖෂධවේදියෙක්
- සමාජ මාධ්‍ය භාවිත කරමින් සමාජ ශාලා සාද ප්‍රවර්ධනය කරන පුද්ගලයෙක්

අධ්‍යයන අරමුණු වලට අනුව සකසාගත් තේමාවන් පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් දත්ත ලබාගැනීමට අවශ්‍ය වූ හෙයින් ඉහත පාර්ශව මූලික තොරතුරු සපයන්නන් ලෙස යොදා ගනිමින් සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.

**සහභාගීත්ව නිරීක්ෂණ(Participatory observation)**

රාත්‍රී සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ චර්යාවන්, මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වන අයුරින් අභ්‍යන්තර හා බාහිර පරිසරය සකස් වී ඇති ආකාරය, මත්ද්‍රව්‍ය සංසරණය වන ස්වභාවය, සාද සංවිධානය වන ආකාරය හා ඒවාට පුද්ගලයින් සම්බන්ධ වන ආකාරය, ඔවුන් නිරූපණය කරන විවිධ සංකේතාත්මක අංග සහ උප සංස්කෘතික චර්යා රටාවන් පිළිබඳ වඩාත් ගැඹුරින් දත්ත රැස් කිරීම සඳහා සහ අනෙක් ශිල්පක්‍රම හරහා ලබාගත් දත්ත වල වලංගුතාවය පරීක්ෂා කිරීම සඳහා මෙම ශිල්ප ක්‍රමය යොදාගන්නා ලදී. අධ්‍යයනය තුළ සහභාගීත්ව නිරීක්ෂණ අවස්ථා දෙකක් සිදුකරන ලද අතර එය තරමක් ප්‍රායෝගිකව දුෂ්කර වූ කාර්යයක් ද විය. ඊට හේතුව

වූයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පරිසරයක් තුළ සිට ඔවුන්ගේ චර්යා නිරීක්ෂණය කිරීමට සිදුවීම සහ අදාළ පුද්ගල කණ්ඩායම් සමග මිශ්‍රවීමේ දී ප්‍රායෝගික දුෂ්කරතා මතුවීමයි. කෙසේනමුත් අපේක්ෂිත තේමාවන්ට අදාළ වඩාත් ගුණාත්මක දත්ත රැස් කිරීමට මේ හරහා අවකාශය සැලසිණි.

**ප්‍රත්‍යයන අධ්‍යයන(Case studies)**

රාත්‍රී සමාජශාලා සාදවලට සහභාගීවී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 03 දෙනෙක් සමඟ ප්‍රත්‍යයක අධ්‍යයන සිදුකරන ලද අතර එහිදී අදාළ පුද්ගලයින්මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම සඳහා බලපාන ලද හේතුන් මෙන්ම මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වාභාවය සහ ඔවුන්ගේ සමාජ ආර්ථික පසුබිම පිළිබඳ වඩාත් ගැඹුරින් දත්ත රැස්කර ගන්නා ලදී.


### 1.10. දත්ත විශ්ලේෂණය

ව්‍යූහගත ප්‍රශ්නාවලි මඟින් රැස්කරන ලද ප්‍රමාණාත්මක දත්ත SPSSමෘදුකාංගය භාවිත කරමින් විශ්ලේෂණය කර ඇත. එහිදී විවිධ විචල්‍ය අතර සහසම්බන්ධතාවන් ද ප්‍රමාණාත්මක වශයෙන් මිණුම් කිරීමට ලක්කර ඇත. ගැඹුරු සම්මුඛ සාකච්ඡා, සහභාගීත්ව නිරීක්ෂණ සහ ප්‍රත්‍යක අධ්‍යයන මඟින් ලබාගත් පුළුල් පරාසයන් තුළවිහිදී ගිය ගුණාත්මක දත්ත තේමාත්මක අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය (Thematic Content Analysis) භාවිත කරමින් ගුණාත්මක ලෙස විශ්ලේෂණය කර ඉදිරිපත් කර ඇත. මෙහිදී දත්ත රැස් කිරීම සඳහා ශිල්ප ක්‍රම කිහියක් යොදාගත් නිසා එක් එක් ශිල්ප ක්‍රම මඟින් රැස්කරන ලද දත්ත වල වලංගුභාවය තහවුරු කරගැනීම සඳහා ත්‍රිකෝණ බද්ධකරණ ක්‍රමය (Triangulation method) යොදාගන්නා ලදී.

**02 වන පරිච්ඡේදය**
**රාත්‍රී සමාජශාලා ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය හා කාලීන ප්‍රවණතා**
**(දේශීය හා ගෝලීය සන්ධර්භය ඇසුරින්)**

රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාද ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව කරන ලද මෙම අධ්‍යයනය තුළ මූලික වශයෙන් හඳුනාගත් විචල්‍යය ආශ්‍රයෙන් ගොඩනගාගත් සංකල්පීය රාමුවක් (Conceptual Framework) ඔස්සේ අධ්‍යයන මාතෘකාවට අදාළව ද්විතියික මූලාශ්‍ර මගින් රැස් කරගත් දත්ත මෙම පරිච්ඡේදය තුළ ගොනු කර ඇත. මේ හරහා දේශීය හා ගෝලීය සන්ධර්භය තුළ කරන ලද අධ්‍යයන අනාවරණ වලට අනුව සහ නිර්මාණය වී ඇති කතිකාවන්ට අනුව සමාජශාලා සාද වල මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ නව ප්‍රවණතා සම්බන්ධ පැහැදිළි අවබෝධයක් ලබා ගත හැකිවනු ඇත.

රූපසටහන් අංක 01 : රාත්‍රී සමාජශාලා සහ වෙරළසාද ආශ්‍රිත මත්ද්‍රව්‍යභාවිතයේ ස්වභාවය සහ කාලීන ප්‍රවණතා පිළිබඳ ද්විතියික මූලාශ්‍ර ඔස්සේ සිදුකරන ලද ගවේෂණයට අදාළ සංකල්පීය රාමුව




## 2.1 සමාජශාලා මත්ද්‍රව්‍ය (club drugs/ party drugs/ dance drugs) පිළිබඳ පාරිභාෂිතය

සමාජශාලා මත්ද්‍රව්‍ය ගණයට ගැනෙන ද්‍රව්‍යය නිර්ණය කිරීම තරමක් දුෂ්කර සහ ගැටලු සහගත තත්ත්වයක් බව උක්ත කරුණ පිළිබඳ පළවී ඇති ද්විතියික මූලාශ්‍ර ඔස්සේ තහවුරු වෙයි. ද්විතීයික මූලාශ්‍ර වලට අනුව අංශ දෙකකට අයත් වර්ගීකරණ හඳුනාගත හැකිය.

- ඖෂධවේදය හෝ රසායනික පදනම මත සිට කරනු ලබන වර්ගීකරණය
- අදාළ මත්ද්‍රව්‍ය වර්ගය භාවිත කරනු ලබන සන්ධර්භය මත සිට කරනු ලබන වර්ගීකරණය

මත්ද්‍රව්‍ය වර්ගය භාවිත කරනු ලබන සන්ධර්භය මත සිට කරනු ලබන වර්ගීකරණය තරමක් දුරටගැටලු සහගත වර්ගීකරණයක් වේ. මන්දයත් සාම්ප්‍රදායිකත්වය මත පදනම් වූ සංස්කෘතීන් අනුව සැකසුණු සාද අවස්ථා වල සහ නූතන සංස්කෘතිය මත පදනම්ව ක්‍රියාත්මක වන සාද අවස්ථාවල පැහැදිලි වෙනසක් හඳුනාගත හැකි බැවිනි. නර්තනය හා බැඳුණු සහ සාද අවස්ථාවන් හා බැඳුණු සංස්කෘතීන් වලට අනුව (dance and party cultures) පහත සඳහන් මත්ද්‍රව්‍ය වර්ග මෙම කාණ්ඩයට ඇතුළත් කළ හැකිය.

- ඇම්පිටමින් (Amphetamine)
- මෙතම්පිටමින් (Methamphetamine)
- එක්ස්ටසි (Ecstasy)
- කොකේන් (Cocaine)
- කෙටමින් (Ketamine – Special K)
- GHB
- වාෂ්පශීලී ද්‍රව්‍ය (Volatile nitrites) (Drugs and crime prevention committee, Parliement of Voctoria,2004: 21)

ඊට අමතරව ගංජා සහ මද්‍යසාර වර්ගයන් ද වැඩි වශයෙන් සමාජශාලා සාද අවස්ථාවන් තුළ භාවිත කරනු ලබයි."party drugs" හෝ "dance drugs" වලට ගැනෙන ද්‍රව්‍ය වර්ගීකරණය කිරීමේ දී ඒවා වීදි මට්ටමේ භාවිත වන මත්ද්‍රව්‍ය (street drugs) කාණ්ඩයෙන් වෙන්කර හඳුනාගැනීමට තරම් පැහැදිලි හෝ අනන්‍ය වූ සීමාවක් නොමැත. උදාහරණයක් ලෙස ඉහළ ගණයේ සමාජශාලා සාද වල භාවිත වනEcstacyවර්තමානය වනවිට වීදි මට්ටමේදී ද අවස්ථානුකූලව භාවිත වන අතර අලෙවි කිරීම ද සිදුවෙයි.
එමෙන්ම "Club drug" යන්න සාමූහික යෙදුමක් (collective term)වන අතර ඇම්පිටමින්, මෙතම්පිටමින්, එක්ස්ටසි (MDMA) සහ කොකේන් වැනි ද්‍රව්‍ය ප්‍රධාන වශයෙන් මෙම කාණ්ඩයට අයත් වන අතර අවස්ථානුකූලව ගංජා හා මද්‍යසාර වැනි ද්‍රව්‍යය මෙන්ම නව මනෝකාරක ද්‍රව්‍ය (New psychoactive drugs)ද මෙම කාණ්ඩය යටතේ සලකනු ලබන අවස්ථා ඇත.

## 2.2 ගෝලීය සන්ධර්භය තුළ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය

ලෝකය පුරා අවස්ථානුකූලව මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් (occasional users) සහ දිනපතා මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් (regular users) යන කණ්ඩායම් දෙකම බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් (poly drug users) බව ලෝක මත්ද්‍රව්‍ය වාර්තාව 2017 පෙන්වා දෙයි. එම වාර්තාවට අනුව වයස අවුරුදු 15-64 අතර වැඩිහිටි ජනගහනයෙන් 5%ක් 2015 වර්ෂයේ දී යම් මත්ද්‍රව්‍යයක් එක් වරකදී හෝ භාවිත කර ඇත. ලෝක ජනගහනයෙන් මිලියන 29.5ක ප්‍රමාණයකට අයත් පුද්ගලයින්

මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතාවයන්ගෙන් පෙළෙන (SUD) පුද්ගලයින් ය. වැඩිහිටි ජනගහනයෙන් 3.8%ක ප්‍රතිශතයක් පසුගිය වර්ෂය තුළ ගංජා භාවිත කර ඇති බව ද 2017 ලෝක මත්ද්‍රව්‍ය වාර්තාව මඟින් අනාවරණය කර ඇත.

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය(UNODC) විසින් ඇස්තමේන්තුගත කරන ලද දත්ත වාර්තා වලට අනුව 2015 වර්ෂයේගෝලීය ඇස්තමේන්තු ගත නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිත කරන ලෝක ජනගහනය මිලියන 255කි. එමෙන්ම ගැටලුකාරී මත්ද්‍රව්‍ය භාවිත (problem drug use) තත්ත්වයට පත්වූ සංඛ්‍යාව මිලියන 29.5කි. එක් එක් මත්ද්‍රව්‍ය වර්ගය භාවිත කරන පුද්ගලයින්ගේ ඇස්තමේන්තුගත සංඛ්‍යාත්මක අගයන් පිළිබඳ සැළකීමේ දී ගංජා භාවිත කරන පුද්ගලයින් මිලියන 35ක්, කොකේන් මත්ද්‍රව්‍ය සඳහා මිලියන 17ක්, ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය සඳහා මිලියන 37ක් සහ Ecstasy භාවිත කරන පුද්ගලයින් සංඛ්‍යාව මිලියන 21ක් වශයෙන් ඇස්තමේන්තුගත කර ඇත. මෙහිදී වඩාත් අවධානයට ලක්වන කරුණක් නම් ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය සහ Ecstasyභාවිත කරන ලෝක ජනගහනයේ ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කිරීමයි. එමෙන්ම ලෝක ජනගහනයෙන් පුද්ගලයින් මිලියන 12ක් යම්කිසි මත්ද්‍රව්‍යයක් එන්නත් කරගනු ලබන අතර එන්නත් කරගන්නා ජනගහනයෙන් මිලියන 1.6ක් HIVවෛරසය ආසාදිතවූවන් වේ. ඊට අමතරව මිලියන 6.1ක් හෙපටයිටිස් සී වෛරසය ද මිලියන 1.3ක් HIVසහ හෙපටයිටිස් සී යන වෛරස දෙකම ආසාදනයවූවන් බව UNODCආයතනය විසින් ඇස්තමේන්තු ගතකර දක්වා ඇත.

EMCDDA(European Monitoring Centre for Drugs and Drug Addiction) 2017 වාර්ෂික වාර්තාවට අනුව යුරෝපා සංගමයට අයත් රටවල් අතර වයස අවුරුදු 15-34 වයස් කාණ්ඩයට අයත් පුද්ගලයින්ගෙන් මිලියන 2.3ක් MDMAභාවිතා කර ඇති අතර මිලියන 1.3ක් ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිත කර ඇති බවට අනාවරණය කර ඇත.

ගෝලීය මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ප්‍රවණතාවයවිමර්ශනය කිරීමේ දී පැහැදිළි වන කරුණක් නම් පොදුවේ සියලු වර්ග වලට අයත් මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවක් හඳුනාගත හැකි අතර ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය, කොකේන් සහ එක්ස්ටසි වැනි ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ප්‍රවණතාවක් ද පවතින බව අනාවරණය වී ඇත. එම මත්ද්‍රව්‍ය වර්ග රාත්‍රී සමාජශාලා හෝ සාද අවස්ථා වල පමණක් භාවිත කරන බවට තහවුරු කළ නොහැකි නමුත් පුද්ගලයින් අවස්ථානුකූලව වීදි මට්ටම තුළ ද අදාළ ද්‍රව්‍ය අවභාවිත කිරීමට යොමුවන අවස්ථා,අත්අඩංගුවට ගැනීම් ආශ්‍රිත දත්ත සහ විවිධ සමීක්ෂණ මඟින් තවදුරටත් තහවුරු කරගෙන ඇත.

### 2.3 ශ්‍රී ලංකාවේ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය හා ප්‍රවණතාවය

යුරෝපා සංගමයට අයත් රටවල් සහ දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවල් හා සංසන්දනය කිරීමේ දී ශ්‍රී ලංකාව තුළඉහළ මත්ද්‍රව්‍ය ව්‍යාප්තියක් පෙන්නුම් නොකළ ද කාලානුරූපීව මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය වැඩිවෙමින් පවතින බව මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ හා

මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා ප්‍රතිකාර ලබාගැනීම් පිළිබඳ දත්ත වලට අනුව පැහැදිළි වෙයි. හෙරොයින් සහ ගංජා සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම් පිළිබඳව අවධානය යොමුකිරීමේ දීකාලානුරූපිව අත්අඩංගුවටගැනීම් වැඩිවීමේ ප්‍රවණතාවක් හඳුනාගත හැකිය.

වගු අංක 01 -2012-2016 දක්වා හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාව

| වර්ෂය | හෙරොයින් | ගංජා |
|---|---|---|
| 2012 | 16,809 | 31,093 |
| 2013 | 23,665 | 42,319 |
| 2014 | 23,331 | 43,683 |
| 2015 | 26,539 | 52,076 |
| 2016 | 27,462 | 47,787 |

(මූලාශ්‍රය - මත්ද්‍රව්‍ය දූර්භාවිත තොරතුරු අත්පොත, 2017)

හෙරොයින් වලට සාපේක්ෂව ගංජා භාවිතයේ ඉහළ ව්‍යාප්තියක් හඳුනාගත හැකිය. ගංජා, සමාජශාලා මත්ද්‍රව්‍ය කාණ්ඩයට සෘජුවම අයත් නොවූවද එවැනි සන්ධර්භ තුළ ශ්‍රී ලංකාවේ ගංජා බහුලව භාවිත කරනු ලබයි.

වගු අංක 02- කොකේන් සහ මනෝවර්තක ද්‍රව්‍ය සම්බන්ධ වාර්තා වූ සිද්ධීන්

| වර්ෂය | කොකේන් | මනෝවර්ථක ගණයේ ද්‍රව්‍ය |
|---|---|---|
| 2012 | 10 | 04 |
| 2013 | - | 02 |
| 2014 | 05 | 01 |
| 2015 | 07 | - |
| 2016 | 22 | 12 |

(මූලාශ්‍රය - මත්ද්‍රව්‍ය දූර්භාවිත තොරතුරු අත්පොත, 2017)

පසුගිය වර්ෂ වලට සාපේක්ෂව 2016 වර්ෂය වනවිට කොකේන් හා මනෝවර්ථක ගණයේ ද්‍රව්‍ය අවභාවිත කිරීම සම්බන්ධ සිද්ධීන්වාර්තාවීමේ ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කර ඇති බව දත්ත වලින් පැහැදිළි වෙයි. “club drug” කාණ්ඩයට අයත් වන මෙවැනි ද්‍රව්‍ය බහුල ලෙස සමාජශාලා සාද ආශ්‍රිතව සංසරණය වන බවට ද්විතියික මූලාශ්‍ර ඔස්සේ තොරතුරු වාර්තා වී ඇත. (පුවත්පත් හා අන්තර්ජාල වාර්තා)

### 2.4 සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ ලක්ෂණ හා චර්යාත්මක ස්වභාවය

සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සමජාතීය කණ්ඩායමක් ලෙසසැළකිය නොහැකි අතර සංස්කෘතික පසුබිම හා සමාජ ආර්ථික පසුබිම මෙන්ම ඔවුන් සහභාගී වන සාද පැවැත්වෙන සන්ධර්භය අනුව පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය මෙන්ම චර්යාවන් ද වෙනස් බව හඳුනාගත හැකිය. විවිධ ද්විතියික මූලාශ්‍ර මඟින් හඳුනාගෙන ඇති ආකාරයට වීදි මට්ටමේ මාදක ගණයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ට (Street opioid users)සාපේක්ෂව සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ යම් වෙනස්කම් හඳුනාගත හැකිය.

- මාදක ගණයේ මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ට වඩා සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් පුළුල් පරාසයන් තුළ බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග භාවිත කරනු ලබයි.
- වීදි මට්ටම තුළමාදක ගණයේ මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ට සාපේක්ෂව සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් වයසින් අඩු හෝ තරුණ පිරිසක් වීම ද විශේෂ ලක්ෂණයකි.
- සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ඔවුන්ගේ ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිත චර්යාවන් සමඟ යම් ආකාරයක පුළුල් මනෝව්‍යාධිමය තත්ත්වයන් පෙන්නුම් කරනු ලබයි.
- සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් ඉහළ වශයෙන් සමාජශීලීත්වය ඇතිකර ගැනීමේ අරමුණින් එම මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබයි.(highly socially oriented)
- සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්, අනෙකුත් මාදක ගණයේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගෙන් වෙනස්ව තමන්ව හඳුනාගැනීමට කැමැත්තක් දක්වන අතර වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සම්බන්ධයෙන් පවත්නා සමාජ අවමානය (Social stigma)හේතුවෙන් ඔවුන් පවතින ප්‍රතිකාර සේවාවන්ට ඇතුළත් වීමට මැලිකමක් දක්වයි.
- සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් ප්‍රතිකාර ලබාගැනීමට අඩු කැමැත්තක් දක්වන අතර ප්‍රතිකාර වලට ඇතුළත් වුවද ප්‍රතිකාර මධ්‍යස්ථාන හෝ ප්‍රතිකාර ක්‍රියාවලිය සමඟ දුර්වල හෝ අවම මට්ටමේ සම්බන්ධතාවයක් පවත්වා ගනියි.
- සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් බොහෝ අවස්ථා වල සිය මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟඋද්ගත වන ගැටලු වලට සහාය ලබාගැනීමේ දී පළමුවෙන් සාමාන්‍ය ජීවිතයේඋපදෙස් දෙන පුද්ගලයෙක් හෝ පවුලේ වෛද්‍යවරයෙක් වෙත යොමුවීමේ ප්‍රවණතාවක් ඇත. (වික්ටෝරියා පාර්ලිමේන්තුවේ මත්ද්‍රව්‍ය හා අපරාධ නිවාරණ කමිටු වාර්තාව, 2004)

එමෙන්ම රාත්‍රී සමාජශාලා සාද ආශ්‍රිතව මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් ආවරණය වූ අවකාශයක් හෝ ඒ සඳහා සකසන ලද පාරිසරිකමය වටපිටාවක් සහිත අවකාශයක සිට මත්ද්‍රව්‍යය වර්ග භාවිත කරන නිසා සාමාන්‍ය මහජනතාවට විවෘත නොවුණු සැඟවුණු කණ්ඩායමක් ලෙස ද ඔවුන්ව හඳුනාගත හැකිය.

එමෙන්ම එක්ස්ටසි හා ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටා සහ පැතිකඩ කාලීනව වෙනස්කම් වලට ලක්වන අතර එය විවිධ භූගෝලීය කලාපයන් සහ ඒවායේ ඇති

මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය වැනි සාධක මත ද වෙනස්කම් වලට ලක්වෙයි. එමෙන්ම වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිතයට කාන්තාවන්ගේ යොමුවීමට සාපේක්ෂව සමාජශාලා තුළමත්ද්‍රව්‍ය භාවිතය සඳහා කාන්තාවන්ගේ වැඩි නැඹුරුතාවක් ඇති බව විවිධ අධ්‍යයන මඟින් පෙන්වා දී ඇත. මෙවැනි මත්ද්‍රව්‍ය භාවිතය ඍජුවමනර්තනඅවස්ථා (dancing events)සහ රාත්‍රී සමාජශාලා සාද වැනි අවස්ථාවන් සමඟ බැඳී පවතියි. එවැනි සාද අවස්ථාවන් වල භාවිත වන සංගීතය, නර්තනය, විදුලි ආලෝකකරණය වැනි පාරිසරිකමය වෙනස්කම් තුළින් මත්ද්‍රව්‍ය මඟින් ලැබෙනු ඇතැයි සලකන ආස්වාදය වැඩි කිරීමට උත්සාහ කරයි.

### 2.5 සමාජශාලා මත්ද්‍රව්‍ය(Club drugs) භාවිතයට යොමුවීමේ බලපෑම් සහගත සාධක

බොහෝවිට තරුණ වයස් මට්ටම් වල පුද්ගලයින් විවිධ හේතූන් මත සහ විශේෂයෙන් මිතුරු බලපෑම මත විවිධ අවිධිමත් කණ්ඩායම් වශයෙන් රාශිගත වෙමින් නොයෙකුත් අපගාමී ක්‍රියාවන් වල නිරත වෙයි. ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිතය හෝ අනෙකුත් සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවන පුද්ගලයින් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී ඔවුන් අදාළසන්ධර්භයන් තුළ එවැනි ද්‍රව්‍ය අවභාවිතයට යොමුවීම කෙරෙහි බලපාන ලද සාධක බොහෝවිට පුළුල් පරාසයක් තුළ විහිද පවතියි. ඇමරිකාවේ ලොස් ඇන්ජලීස් නගරය ආශ්‍රිතව පොදු ප්‍රතිකාර සේවාවන්ට ඇතුළත් වූ ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍යභාවිත කරන පුද්ගලයින් 260 දෙනෙක් ආශ්‍රයෙන් Mayrhauser, Brecht සහAglin යන පර්යේෂකයින් විසින් 2002 වර්ෂයේ දී සිදුකරන ලද අධ්‍යයන අනාවරණ වලට අනුව ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය භාවිතයට පුද්ගලයින් යොමුවීම කෙරෙහි බලපාන ලද සාධක මෙසේය. නියැදියෙන් 28%ක ප්‍රතිශතයක් අනෙකුත් උත්තේජකයන්ට වඩා ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය පහසුවෙන් ලබාගත හැකිවීම, වඩාත් ආරක්ෂාකාරී වීම සහ උපරිම ආස්වාදයක් ලැබීම වැනි හේතූන් නිසා භාවිතයට යොමු වී ඇත. ඊට අමතරව නියැදියෙන් 23%ක ප්‍රතිශතයක් අවදියෙන් සිටීම සඳහාත්, 11%ක ප්‍රතිශතයක් ලිංගික ශක්තිය වර්ධනය කර ගැනීම සඳහාත්, 10%ක ප්‍රතිශතයක් ශරීරයේ බර අඩු කර ගැනීම සඳහාත්, ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය භාවිතයට යොමුවී ඇති බව අදාළ අධ්‍යයනය තුළින් අනාවරණය විය.

වෙනත් අධ්‍යයන වලින් තහවුරු වී ඇති ආකාරයට බොහෝ අවස්ථාවල තරුණ පුද්ගලයින් කුතුහලය නිසා මෙවැනි ද්‍රව්‍ය භාවිතය අත්හදා බලන අතර තරුණ පුද්ගලයින් සිය ශරීරයේ වේදනාව නැතිකර ගැනීම (Self-medicate)සඳහා ඇම්පිටමින් වර්ගයේ උත්තේජක වර්ග භාවිත කරනු ලබයි.

වික්ටෝරියා පාර්ලිමේන්තුවේ මත්ද්‍රව්‍ය හා අපරාධ නිවාරණ කමිටු වාර්තාව, 2004උපුටා දක්වන පරිදි රාත්‍රී සමාජශාලා වලට ආකර්ෂණයක් ඇති කරනු ලබන සාධක කිහිපයක් අනාවරණය කරගෙන ඇත.

01. සංගීතය(Electronic Music)
02. ආලෝකකරණය
03. නර්තනයට අවස්ථා(Electronic dance and Music - EDM)
04. මිතුරු සබඳතා භාවිත කරමින් මත්ද්‍රව්‍ය මිලදී ගත හැකිවීම

## 2.6 සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිතයේ බලපෑම

ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය ඇතුලු අනෙකුත් සමාජශාලා වල භාවිත වන මත්ද්‍රව්‍ය භාවිතයේ කෙටිකාලීන හා දිගුකාලීන බලපෑම් රාශියක් හඳුනාගත හැකි අතර ද්විතියික මූලාශ්‍ර වලට අනුව පහත පරිදි සාරාංශ ගත කළ හැකිය.

**ශාරීරික වශයෙන් ඇතිවිය හැකි දිගුකාලීන බලපෑම්**

නින්ද ආශ්‍රිත ගැටලු
මානසික අවපාතයන්
ක්‍රියාවන් නැවත නැවත කිරීම
විශාදය
කාංසාව
සමාජ හා මූල්‍යමය ගැටලු
හෘදය ආශ්‍රිත අක්‍රමතා
හිසරදය
සංදි වේදනා
බර අඩුවීම හා අඩු පෝෂණය
අධි රුධිර පීඩනය
ප්‍රතිශක්තිකරණය දුර්වල වීම
මනෝ භ්‍රාන්තීන් ඇති වීම
චර්යාත්මක ගැටලු
සංජානන ගැටලු

**සමාජමය බලපෑම්**

ප්‍රචණ්ඩත්වය හා අපරාධ
අනතුර

## 03 වන පරිච්ඡේදය
## අධ්‍යයන ප්‍රතිඵල හා සාකච්ඡාව

අධ්‍යයන අනාවරණ සහ ද්විතික දත්ත පදනම් කරගනිමින් සිදුකරන ලද විශ්ලේෂණය තුළින් සාකච්ඡාවට බඳුන් කළ යුතු ප්‍රධාන තේමාවන් කිහිපයක් මෙම පරිච්ඡේදය තුළ සංගෘහිත කර ඇත.

1. අධ්‍යයනයට ලක්කළ දත්ත දායකයින්ගේ (ප්‍රතිචාරකයින්ගේ) ප්‍රජා සහ සමාජ පැතිකඩ
2. රාත්‍රි සමාජශාලා සාද වලට සහභාගී වන පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය
3. රාත්‍රි සමාජශාලා සාදවල මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත පුද්ගල චර්යාවේ ස්වභාවය

### 3.1. ප්‍රතිචාරකයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ


#### 3.1.1. ස්ත්‍රී පුරුෂ සංයුතිය

හිමබෝල නියැදි ක්‍රමය භාවිත කරමින් අධ්‍යයනය සඳහා ඇතුළත් කරගන්නා ලද දත්ත දායකයින් අතුරින් 42 (84%) දෙනෙක් පුරුෂයින් වූ අතර 8 (16%) දෙනෙක් ස්ත්‍රීන් වූහ.

#### 3.1.2.වයස් මට්ටම

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් බහුතරයක් වයස අවුරුදු 25ට වඩා අඩු පුද්ගලයින් වූ අතර, වයස අවුරුදු 18 - 20 ත් අතර වයස් ඛාණ්ඩයට අයත් පුද්ගලයින් 10 (20%) දෙනෙක්, වයස අවුරුදු 21 -25 ත් අතර වයස් ඛාණ්ඩයට අයත් පුද්ගලයින් 23 (46%) දෙනෙක් සහ වයස අවුරුදු 26 -30 වයස් ඛාණ්ඩයට අයත් පුද්ගලයින් 11 (22%)දෙනෙක් අධ්‍යයනයට භාජනය කරන ලද නියැදිය තුළ නියෝජනය විය. දත්ත දායකයින්ගේ වයස් මට්ටම් පිළිබඳ අධ්‍යයනය කිරීමේදී පැහැදිළි වන කරුණක් නම් වයස අවුරුදු 21 - 25ත් අතර පුද්ගලයින් රාත්‍රි සමාජශාලා සාද වලට සහභාගී වීම සම්බන්ධයෙන් ඉහළ ආකර්ෂණයක් සහ ප්‍රවණතාවයක් පවතින බවයි.

**ප්‍රස්තාර අංක 01 - වයස් මට්ටම අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය**




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2017)


### 3.1.3.පදිංචි ප්‍රදේශ අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය

රාත්‍රි සමාජශාලා සාද/ වෙරළ සාද වලට සහභාගී වන පුද්ගලියින් 50 දෙනෙක් අධ්‍යයනය සඳහා තෝරාගන්නා ලද අතර එහිදි අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික හා උප නාගරික ප්‍රදේශ තෝරා ගන්නා ලදී. රාත්‍රි සමාජශාලා සහ මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ව්‍යාප්තියක් සහිත කලාපයක් වීම කොළඹ දිස්ත්‍රික්කය අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගැනීමේ පදනම විය. ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කය තුළ ස්ථානගත වී ඇති සමාජශාලා වලට සහභාගී වන පුද්ගලයින් අධ්‍යයනට භාජනය කරන ලද අතර ඔවුන්ගේ පදිංචිය සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

අධ්‍යයනයේ දත්ත දායකයින්ගෙන් 21 (42%) දෙනෙක් කොළඹ දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන් වූ අතර 29 (58%) දෙනෙක් එනම් බහුතරයක් වෙනත් දිස්ත්‍රික්ක වල පදිංචි පුද්ගලයන් වූහ. ඔවුන් කොළඹ දිස්ත්‍රික්කය තුළ තාවකාලිකව පදිංචි වි සිටින පුද්ගලයන් වූ අතර විවිධ රැකියා හා වෘත්තීන් වල නියැලිමේ අරමුණින් එසේ ඔවුන් තාවකාලිකව පදිංචිව සිටියි.

අධ්‍යයන දත්ත වලට අනුව නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් අතුරින් 18 (36%) දෙනෙක් ගම්පහ දිස්ත්‍රික්කයේද, පුද්ගලයින් 04 (8%)දෙනෙක් පුත්තලම දිස්ත්‍රික්කයේද, පුද්ගලයින් 03 (06%)කුරුණෑගල දිස්ත්‍රික්කයේද පදිංචි අය වූහ. ඊට අමතරව අනෙකුත් පුද්ගලයින් මාතර, කළුතර හා නුවරඑළිය යන දිස්ත්‍රික් වල ස්ථිර පදිංචියක් සහිත පුද්ගලයින් විය.

**ප්‍රස්තාර අංක 02 - පදිංචි ප්‍රදේශ අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය**




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2017)

### 3.1.4.ජනවර්ගය සහ ආගම අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය

ජනවර්ගය අනුව අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය පිළිබඳව අවධානය යොමු කිරීමේදී බහුතරයක් එනම් 49 (98%) දෙනෙක් සිංහල ජාතිකයන් වූ අතර එක් ද්‍රවිඩ ජාතිකයෙක් විය. ආගම් අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය පිළිබඳ සලකන විට 35 (70%) දෙනෙක් බෞද්ධගාමිකයන් ද, 5 (10%) දෙනෙක් ක්‍රිස්ත්‍රියානි ආගමිකයන් සහ 9 (18%) දෙනෙක් රෝමානු කතෝලික ආගමිකයින් වුහ.

### 3.1.5.අධ්‍යාපන මට්ටම අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය

අධ්‍යයන නියැදිය සඳහා තෝරා ගන්නා ලද පුද්ගලයින්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳ විශ්ලේෂණය කිරීමේදි 16 (32%) දෙනෙක් අ. පො. ස සාමාන්‍ය පෙළ සමත් පුද්ගලයින් වූ අතර 16 (32%) දෙනෙක් අ. පො. ස උසස් පෙළසමත්වුවන්ය. ඊට අමතරව පුද්ගලයින් 13 (26%) දෙනෙක් යම්කිසි විෂය ක්ෂේත්‍රයකට අදාළව ඩිප්ලෝමා පාඨමාලා හදරා ඇති අතර පුද්ගලියන් 7 (4%) දෙනෙක් උපාධි මට්ටම දක්වා අධ්‍යාපනය ලද පුද්ගලයින් වුහ. 10 ශ්‍රේණිය දක්වා (ද්විතියික අධ්‍යාපනය) දක්වා අධ්‍යාපනය ලද පුද්ගලයින් 3 (6%) දෙනෙක් පමණක් නියැදිය තුළ නියෝජනය වූ අතර අධ්‍යාපනයක් නොලද හෝ ප්‍රාථමික මට්ටම දක්වා පමණක් අධ්‍යාපනය සාධනය කරගත් පුද්ගලයින් කිසිවෙක් නියැදිය තුළ නියෝජනය නොවීම සුවිශේෂී ලක්ෂණයකි. එමෙන්ම අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ බහුතර පුද්ගලයින් සංඛ්‍යාවක් ඉහළ අධ්‍යාපන මට්ටමක් ළගා කරගෙන ඇති පුද්ගලයින්ය. එනම් පුද්ගලයින් 31 (62%) දෙනෙක් අ.පො.ස උසස් පෙළ හෝ ඊට ඉහළ අධ්‍යාපන මට්ටමක් සාධනය කර ඇත.

මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වූ පුද්ගලයින්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳව ද්විතියික මූලාශ්‍ර වලට වාර්තා වී ඇති දත්ත විශ්ලේෂණය කිරීමේදී ඉහත තත්ත්වයට වඩා වෙනස් ප්‍රවණතාවයක් හඳුනා ගත හැකිය. පසුගිය වසර කිහිපයක මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරිත්වය සඳහා ප්‍රතිකාර වලට ඇතුළත් වූ පුද්ගලයින්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳ දත්ත පහත වගුව තුළ දක්වා ඇත.

**වගු අංක 03 - අධ්‍යාපන මට්ටම අනුව ප්‍රතිකාර සඳහා ඇතුලත් වූ පුද්ගලයින්ගේ ව්‍යාප්තිය**

| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| පාසල් නොගිය | 65 | 31 | 86 | 55 | 120 |
| 05 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලද | 147 | 124 | 195 | 149 | 267 |
| 05 ශ්‍රේණිය හා 8 ශ්‍රේණිය අතර | 219 | 206 | 313 | 266 | 398 |
| 9 ශ්‍රේණිය හා 10 ශ්‍රේණිය අතර | 296 | 479 | 596 | 485 | 873 |
| O/ L සමත් | 210 | 299 | 288 | 272 | 501 |
| A/L සමත් | 110 | 172 | 145 | 147 | 173 |
| උපාධි/ ඩිප්ලෝමා | 17 | 23 | 05 | 20 | 20 |

(මූලාශ්‍රය - ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත, 2017)

ඉහත දත්ත විමර්ශනය කිරිමේදී පැහැදිළිවන වැදගත් ප්‍රවණතාවයක් වන්නේ, මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරිත්වය සඳහා ප්‍රතිකාර වලට ඇතුළත් වූ පුද්ගලයින්ගෙන් බහුතරයක් 9 ශ්‍රේණිය හෝ 10 ශ්‍රේණිය දක්වා පමණක් අධ්‍යාපනය ලද පුද්ගලයින් වීමයි. 2012 - 2016 වර්ෂය දක්වා එම ප්‍රවණතාවය වෙනසකට ලක් නොවීමද සුවිශේෂි ලක්ෂණයකි. මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ පැතිකඩ (Profile of Drug Users)පිළිබඳ අවධානය යොමු කිරීමේදී ඔවුන්ගේ අඩු අධ්‍යාපන මට්ටම මත්ද්‍රව්‍ය භාවිතය සමග සාකච්ඡාවට බඳුන්වන ප්‍රධාන ලක්ෂණයකි.

නමුත් රාත්‍රි සමාජශාලා හෝ වෙරළ සාද වලට සහභාගී වි මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පිළිබඳ අවධානය යොමු කිරීමේදී අධ්‍යයන දත්ත වලට අනුව ඔවුන් ඉහළ අධ්‍යාපන මට්ටමක් සාධනය කරගෙන ඇති බව අනාවරණය වී ඇත.

### 3.1.6.විවාහක අවිවාහක බව


විවාහක අවිවාහක බව අනුව දත්ත දායකයින් වර්ගීකරණය කිරීමේදී නියැදිය තුළ විවාහක පුද්ගලයින් 6 (12%) දෙනෙක්, අවිවාහක පුද්ගලයින් 37 (74%) දෙනෙක්, විවාහ නොවී එකට ජීවත්වන පුද්ගලයින් දෙදෙනෙක් සහ විවාහක නමුත් වෙන්ව ජීවත්වන පුද්ගලයින් තිදෙනෙක් (6%) නියෝජනය වුහ.

### 3.1.7.ආදායම් මාර්ගසහ මාසික ආදායම අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය

ආදායම් මට්ටම සහ ආදායම් මාර්ග සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන ලද දත්ත දායකයින් අතුරින් 16 (32%) දෙනෙක් පුහුණු ශ්‍රමිකයන් (Skill labours) ලෙස රැකියාවේ යෙදෙන අතර 11 (32%) දෙනෙක් ව්‍යාපාරික කටයුතු වල නිරත වී සිටිති. ඊට අමතරව 5 (10%) දෙනෙක් නුපුහුණු ශ්‍රමිකයින් ලෙස විවිධ මට්ටමේ රැකියා වල නිරත වෙති. එම නුපුහුණු ශ්‍රමිකයින් අතර කම්කරුවන් ලෙස හෝ කුලී පදනම මත සේවය සපයන පුද්ගලයින් වුහ.

නියැදිය තුළ නියෝජනය වු පුද්ගලයින් අතුරින් 4 (8%) දෙනෙක් දැනට රැකියාවක නිරත නොවන අතර අධ්‍යාපන කටයුතු වල නිරත වී සිටියි. එක් පුද්ගලයෙක් ප්‍රවාහන සේවකයෙක් ලෙස කටයුතු කරනු ලබන අතර පුද්ගලයින් 13 දෙනෙක් රැකියාව සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වා නොමැත.

**ප්‍රස්තාර අංක 03 - නිරත වන රැකියාව/ වෘත්තිය අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය**




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2017)

පුහුණු ශ්‍රමිකයන් ලෙස රැකියාවේ නියතු පුද්ගලයින් නිරත වන ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කිරීමේදී පුද්ගලයින් සිව් දෙනෙක් සංචාරක කර්මාන්තය ආශ්‍රිත රැකියාවල නිරත වන අතර එක් පුද්ගලයෙක් සංගීත කණ්ඩායමක ශිල්පියෙක් ලෙස සේවය කරනු ලබයි. ඊට අමතරව තවත් පුද්ගලයින් 10 දෙනෙක් පෞද්ගලික අංශයේ විවිධ රැකියා වල නිරත වෙති.

මාසික ආදායම් තත්ත්වය පිළිබදව ප්‍රතිචාර දක්වන ලද පුද්ගලයින් අතුරින් මාසික ආදායම රුපියල් 10,001ත් රුපියල් 30,000ත් අතර පුද්ගලයින් 8 (16%) දෙනෙක් සහ රුපියල් 30,001 - 50,000 ත් අතර මාසික ආදායමක් ඇති පුද්ගලයින් 10 (20%) දෙනෙක් නියැදිය තුළ නියෝජනය විය. රු. 50,001 - රු 70,000 ත් අතර ආදායමක් ලබන පුද්ගලයින් 9 (18%) දෙනෙක් ද සිය මාසික ආදායම් මට්ටම පිළිබඳ ප්‍රතිචාර දක්වන ලද පුද්ගලයින් අතර විය. අධ්‍යයන නියැදියෙන් බහුතරයක් පුද්ගල සංඛ්‍යාවක් රු. 30,001 - 50,000 අතර මාසික ආදායමක් ලබන පුද්ගලයන් වේ.


### 3.2. රාත්‍රි සමාජශාලා සාදවලට සහභාගී වන පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ රටාවන්

අධ්‍යයන නියැදිය සඳහා හිමබෝල නියැදි ක්‍රමය භාවිත කරමින් රාත්‍රි සමාජශාලා සාද වලට සහභාගි වී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 50 දෙනෙක් ඇතුළත් කරගන්නා ලද අතර ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත චර්යාවේ ස්වභාවය සහ මත්ද්‍රව්‍ය භාවිත පැතිකඩ සම්බන්ධයෙන් අධ්‍යයනය තුළ අවධානය යොමු කරන ලදී. ඒ අනුව පහත සංරචක හා තේමාවන් යටතේ සිදුකරන ලද ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සහ තේමාත්මක අන්තර්ගත විශ්ලේෂණය මගින් ලද අනාවරණයන් මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡාවට බඳුන් කර ඇත.

### 3.2.1. මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ වයස් මට්ටම

අධ්‍යයනයට සම්බන්ධ වු දත්ත දායකයින්ගෙන් 2(4%) දෙනෙක් වයස අවුරදු 11 - 14 අතර වයස් මට්ටමකදී ද, 27(54%) දෙනෙක් වයස අවුරුදු 15 - 17 වයස් මට්ටමකදී ද ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කිරීම ආරම්භ කර ඇත. ඊට අමතරව පුද්ගලයින් 15 (30%) දෙනෙක් වයස අවුරුදු 18 - 21ත් අතර වයස් මට්ටමකදි යම් මත්ද්‍රව්‍යයක් ප්‍රථම වරට භාවිත කර ඇත. සමස්ත නියැදියෙන් බහුතර පුද්ගල සංඛ්‍යාවක් වයස අවුරදු 15 - 17 අතර වයස් මට්ටකදී ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කරීම ආරම්භ කර ඇත.

ප්‍රස්තාර අංක 04 - **පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමේ වයස් මට්ටම්**




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2017)

පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ අවදානම් වයස් බාණ්ඩය ලෙස වයස අවුරුදු 17 හෝ ඊට අඩු වයස් මට්ටමක් විය හැකි බව Substance Abuse and Mental Health Services Administration Treatment Episode data set (2014) වාර්තාව මගින් පැහැදිළි කරයි. මෙම අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වු පුද්ගලයින් 50 දෙනා අතුරින් පුද්ගලයින් 30 (80%) දෙනෙක් වයස අවුරුදු 17 හෝ ඊට වඩා අඩු වයස් මට්ටමකදී ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිතය ආරම්භ කර ඇත. අධ්‍යයන දත්ත වලට අනුව යම් පුද්ගලයෙක් ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත කිරිමේ සාමාන්‍ය වයස් මට්ටම අවුරුදු 17කි.

**වගු අංක 04- පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ වයස් මට්ටම**

| වයස (අවුරුදු) | පුද්ගලයින් සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| < = 17 | 30 | 60 |
| 18 - 23 | 16 | 32 |
| 24> | 4 | 8 |

(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2017)

### 3.2.2. ප්‍රථම වරට භාවිත කරන ලද මත්ද්‍රව්‍ය වර්ග (ප්‍රාථමික මත්ද්‍රව්‍ය)

මත්ද්‍රව්‍ය භාවිත චාර්යාව ආරම්භ කිරීමේදී පුද්ගලයින් විසින් භාවිත කරන ලද මත්ද්‍රව්‍ය වර්ග පිළිබඳ අවධානය යොමු කිරීමේදී පුද්ගලයින් 6 (12%) දෙනෙක් බියර් ප්‍රථම වරට භාවිත කර ඇති අතර පුද්ගලයින් 5 (10%) දෙනෙක් මද්‍යසාර ප්‍රථම මත්ද්‍රව්‍ය ලෙස අත්හදාබලා ඇත. සමස්ත නියැදියෙන් බහුතර පුද්ගලයින් සංඛ්‍යාවක් එනම් 39 (78%) දෙනෙක් සිගරැට් ප්‍රථම මත්ද්‍රව්‍ය ලෙස භාවිත කර ඇත.

### 3.2.3.මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුවීමට බලපාන ලද සාධක

පුද්ගලයෙක් ඉහත වයස් සීමාවන් තුළ යම් ද්‍රව්‍යයක් භාවිත කිරීම අත්හදා බැලීම සඳහා හේතු වූ කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමේදී පුද්ගලයින් 25 දෙනෙක් කුතුහලය හේතුවෙන්ද පුද්ගලයින් 22 දෙදෙනෙක් මිතුරු බලපෑම හේතුවෙන් ද යම් මත්ද්‍රව්‍ය වර්ගයක් අත්හදා බැලීමට යොමු වී ඇත. ඊට අමතරව පුද්ගලයින් 21 දෙනෙක් සතුට, විනෝදය පිණිස සහ පුද්ගලයින් 07 දෙනෙක් ගැටලුකාරී තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් මත්ද්‍රව්‍ය භාවිත කිරීම ආරම්භ කර ඇත.


සිදුකරන ලද ප්‍රත්‍යෙක අධ්‍යයන අනුව පවුලේ සමීපතමයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ බලපෑම හේතුවෙන් ද පුද්ගලයින් මත්ද්‍රා භාවිතයට යොමුවන බව අනාවරණයවිය. ප්‍රත්‍යයක අධ්‍යයන දත්ත වලට අනුව තම පියා සහ පවුලේ අනෙකුත් පුද්ගලයින් නිවසේ සිට මත්ද්‍රව්‍ය භාවිත කිරීම දැකීමෙන් ඇතිවන ආශාව හෝ කුතුහලය නිසා මත්ද්‍රව්‍ය භාවිත කිරීමට යොමු වී ඇති පුද්ගලයින් ද හඳුනාගත හැකිවිය. එමෙන්ම මිතුරු බලපෑම (peer pressure) මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම කෙරෙහි බලපෑම් ඇති කරවන ප්‍රධාන සාධකයකි.

### 3.2.4. රාත්‍රි සමාජශාලාවල භාවිත කරන මත්ද්‍රව්‍ය වර්ග

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් සියලු දෙනා රාත්‍රි සමාජශාලා සාද හෝ වෙරළ සාද වැනි අවස්ථාවන්ට සහභාගීවන අතර එවැනි අවස්ථා වල විවිධ මත්ද්‍රව්‍ය භාවිත කිරීම පුරුද්දක් වශයෙන් පවත්වා ගෙන යනු ලබයි. ඔවුන් භාවිත කරන එක් එක් මත්ද්‍රව්‍ය හා මත්පැන් වර්ග පිළිබඳ අවධානය යොමු කිරීමේදි පුද්ගලයින් 47 දෙනෙක් සිගරට් භාවිත කරනු ලබන අතර පුද්ගලයින් 48 දෙනෙක් මද්‍යසාර වර්ග භාවිත කරනු ලබයි. එමෙන්ම ගංජා භාවිත කරනු ලබන පුද්ගලයින් 42 දෙනෙක් සහ 21 දෙනෙක් හෙරොයින් භාවිත කර ඇති අතර පුද්ගලයින් 22 දෙනෙක් හෂිස් භාවිත කරනු ලබයි.

අධ්‍යයන නියැදිය තුළ සංගෘහිත වූ පුද්ගලයින් 50 දෙනාගෙන් 45 දෙනෙක් LSD භාවිත කරන අතර 49 දෙනෙක් එක්ස්ටසි භාවිත කරනු ලබයි. ඊට අමතරව පුද්ගලයින් 28 දෙනෙක් කොකේන් භාවිත කරනු ලබන අතර 28 දෙනෙක් මෙතම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබයි. මේ අනුව පැහැදිළිවන ප්‍රධාන කරුණක් නම් රාත්‍රි සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් බවයි.

**ප්‍රස්තාර අංක 05 - රාත්‍රි සමාජශාලා සාද වල භාවිත කරන මත්ද්‍රව්‍ය/ මත්පැන් වර්ග**




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2017)

Drugs and crime prevention committee, Parliement of Voctoria, 2004 වාර්තාවෙහි සඳහන් සමාජශාලා මත්ද්‍රව්‍ය (party drugs/ club drugs) වර්ගීකරණය අනුවLSD,එක්ස්ටසි, කොකේන්, මෙතම්පිටටින් හා ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය ප්‍රධාන වශයෙන් සමාජශාලා මත්ද්‍රව්‍ය කාණ්ඩයට අයත් වේ. අධ්‍යයන නියැදිය තුළනියෝජනය වූ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය පිළිබඳ දත්ත වලට අනුව

ඉහත වර්ගීකරණයට අදාළවිවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් හඳුනාගත හැකිවිය. එම එක් එක් මත්ද්‍රව්‍ය වර්ග භාවිත කරන පුද්ගලයින්ගේ පැතිකඩ සහ ඒ ආශ්‍රිත චර්යාවන් පහත විස්තර කර ඇත.

### 3.2.4.1.Ecstasy

අධ්‍යයනය සඳහා සම්බන්ධ වූ පුද්ගලයින් 50 දෙනාගෙන් 49 දෙනෙක් එක්ස්ටසි භාවිත කරනු ලබයි. සාද අවස්ථා වලට සහභාගි වන පුද්ගලයින් එක්ස්ටසි සඳහා “pill” යන අන්වර්ථ නාමය භාවිත කරනු ලබයි. දත්ත දායකයින් විසින් අනාවරණය කරන ලද කරුණු වලට අනුව බොහෝ අවස්ථා වල සමාජශාලා වලට පැමිණෙන විට එක්ස්ටසි පෙති රැගෙන එන අතර ඇතැම් අවස්ථා වල සමාජශාලා ඇතුළත ඒවා අලෙවි කරනු ලබන පුද්ගලයින්ගෙන් (ඇතැම් විට සමාජශාලා වල සේවය කරන්නන්) මිලදී ගනු ලබයි.

එක්ස්ටසි පෙති සාද වලට පැමිණෙන විට බාහිර ස්ථානයකින් රැගෙන ඒමට බොහෝ පුද්ගලයින් යොමුවී සිටින අතර එයට ප්‍රධාන හේතුවක් ලෙස ඔවුන් විසින් සඳහන් කර ඇත්තේ සමාජශාලා ඇතුළත ඉහළ මිල ගණන් යටතේ ආදාළ මත්ද්‍රව්‍ය අලෙවි කිරීමයි. එමෙන්ම ඔවුන්ගේ අදහස් වලට අනුව ඇතැම් අවස්ථා වල තත්ත්වයෙන් අඩු ව්‍යාජ මත්ද්‍රව්‍ය හා ඒ වෙනුවට වෙනත් ආදේශක වර්ග රාත්‍රි සමාජශාලා තුළ අලෙවි කරනු ලබයි. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් විසින් එවැනි ව්‍යාජ මත්ද්‍රව්‍ය (Fake Drugs) හෝ ඔවුන් අපේක්ෂා කරන මට්ටමට තෘප්තියක් ගෙන නොදෙන මත්ද්‍රව්‍ය භාවිත කිරීමට ඇති අකමැත්ත නිසා සමාජශාලාවලට පැමිණෙන විට ඔවුන්ට අවශ්‍ය ප්‍රමාණයට එක්ස්ටසි පෙති බාහිරින් රැගෙන එනු ලබයි. එසේ රැගෙන එන ප්‍රමාණය ප්‍රමාණවත් නොවන අවස්ථා වල සමාජශාලා ඇතුළත මත්ද්‍රව්‍ය අලෙවි කරනු ලබන පුද්ගලයින්ගෙන් ඒවා මිලදි ගනු ලබයි.

එක්ස්ටසි භාවිත කරන පුද්ගලයින් ඔවුන්ගේ භාවිතය සම්බන්ධයෙන් සිදුකරන ලද ප්‍රකාශ විශ්ලේෂණය කිරීමේදි සතුට හා විනෝදය ලබා ගැනීමට මෙන්ම අනෙක් පුද්ගලයින් සමග මිත්‍රශිලි හා සුහදශීලි ලෙස ගනුදෙනු කිරීම වැනි පරමාර්ථ සහිතව ඔවුන් එක්ස්ටසි භාවිත කරනු ලබයි. ඒ අනුව එක්ස්ටසි භාවිත කරනු ලබන පුද්ගලයින්ගේ ප්‍රකාශ හා අත්දැකීම් විවිධ තේමා අනුව විශ්ලේෂණය කිරීමේදි උප ශීර්ෂ 04ක් යටතට ගොනුකළ හැකිය.

- සතුට දනවන හැඟීම් (Feeling of euphoria)
- සහකම්පනය ප්‍රකාශ කරවන හැඟීම් (Empathy)
- ශක්තිය වැඩි කිරීමට (Increasied energy)
- මෘදු මායාවන්/ භ්‍රාන්තින් (Mild hallucinations)

**වගු අංක 05 - එක්ස්ටසි භාවිතය සම්බන්ධයෙන් පුද්ගලයින් විසින් ඉදිරිපත් කරන ලද අදහස්**

| සතුට දනවන හැඟීම් | සහකම්පනය ප්‍රකාශ කරවන හැඟීම් | ශක්තිය වැඩි කිරීමට | මෘදු මායාවන්/ භ්‍රාන්තීන් |
|---|---|---|---|
| "දවසෙම සතුටින් ඉන්න පුලුවන්" | "යහළුවෝ එක්ක set වෙන්න පුලුවන්" | "කොච්චර වෙලාවක් නැටුවත් මහන්සියක් නැහැ" | "lighting එක්ක හොඳට feel වෙනවා" |
| "ප්‍රශ්න අමතක වෙනවා" | "අපි එක set එකක් විදියට ගොඩක් parties වලදී එකතු වෙනවා" | "Music එක්ක නටන්න හොඳ energy එකක් ඕන" | "වෙනම ලෝකයක් වගේ පේනවා" |
| "හොඳට නටන්න පුලුවන්" | | | |
| "වෙනසක් අත්විඳින්න පුලුවන්" | | | |

(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2017)

එක්ස්ටසි භාවිත කරන පුද්ගලයින්ගේ පරිකල්පනයට අනුව (බොහෝවිට මිථ්‍යා මතයන් වේ) රාත්‍රී සමාජශාලාවල භාවිත වන සංගීත ප්‍රභේද රසවින්දනය කිරීමට හා ඒ සමඟ නර්තනයේ යෙදීම සඳහාඔවුන් එක්ස්ටසි භාවිත කරනු ලබයි. විශේෂයෙන් වැඩි වේලාවක් නර්තනයේ යෙදීමට සහ ඉලෙක්ට්‍රෝනික සංගීත ප්‍රභේද සහ ආලෝකකරණය සමඟ මායාකාරී හැඟීම් හා සතුට දනවන හැඟීම් ඇතිකර ගැනීමට මෙලෙස ඔවුන් එක්ස්ටසි භාවිත කරන බව අනාවරණය කරන ලදී. ඉහත මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ අත්දැකීම් සහ අදහස් විශ්ලේෂණය කිරීමේදී පැහැදිළි වන කරුණක් වන්නේ ඔවුන් සිය මත්ද්‍රව්‍ය භාවිතය පවත්වා ගැනීමට හෝ අදාළ චර්යාවන් දීර්ඝ කාලීනව පවත්වා ගැනීමට විවිධ සාධාරණීකරණ ගොඩනගා ගෙන ඇති බවයි. එම විශ්වාස සහ අත්දැකීම් බොහෝවිට වැරදි පරිකල්පනයන් (Mis perceptions)මත පදනම් වී ඇත.

### 3.2.4.2.LSD (Lysergic Acid Diethylamide)

අධ්‍යයන නියැදියෙන් පුද්ගලයින් 45 දෙනෙක් LSDභාවිත කරනු ලබන අතර ඔවුන් රාත්‍රී සමාජශාලා සාද වලට සහභාගී වීමේදී බාහිරින් අදාළ මත්ද්‍රව්‍ය ප්‍රමාණ රැගෙන යයි. එයට හේතුව එක්ස්ටසි මෙන්මLSD සම්බන්ධයෙන් සමාජශාලා ඇතුළත ඉහළ මිල ගණන් යටතේ ලබාගැනීමට සිදුවීම සහ ව්‍යාජ හා අපේක්ෂා කරන ප්‍රමිතියට වඩා අඩු වර්ගයේ ද්‍රව්‍ය මිලදී ගැනීමට සිදුවීමයි.LSDහැඳින්වීම සඳහා රාත්‍රී සමාජශාලා වලට සහභාගී වන පුද්ගලයින් "Acid" යන අන්වර්ථ නාමය බහුලව භාවිත කරනු ලබයි. LSDභාවිත කරන පුද්ගලයින් විසින් අත්දකින ලද අවස්ථාවන් අනුව වර්ග දෙකකට අයත් භ්‍රාන්තිකාරී අත්දැකීම්(hallucinations) වලට අනුව මුහුණ දී ඇත.

- LSD "good trip" experience
- LSD "bad trip" experience

## LSD “good trip” experience

LSD භාවිත කරන බහුතරයක් පුද්ගලයින් විසින් මෙම ගණයට ගැනෙන අත්දැකීමක් බලාපොරොත්තු වෙයි. සාමාන්‍යයෙන් LSDසුළු ප්‍රමාණයක් ශරීරගත වූ පසු පැය 8-12ත් අතර කාලයක් එහි බලපෑම ශරීරය විසින් අත්දකින බව භාවිත කරන්නන්ගේ අත්දැකීම් හා අදහස් විමර්ශනය කිරීමේ දී පැහැදිලි වේ. good trip ගණයට අයත් අත්දැකීම් ලබාගත් පුද්ගලයින්ට අනුව සතුට දනවන හැඟීම්, අලංකාර දර්ශන, පුදුම සහගත මායාකාරී හැඟීම් අර්ථවත් මානව සම්බන්ධතා වැනි දේ ඇතිවන අවස්ථා “good trip”වශයෙන් සළකන අතර LSDභාවිත කරන්නන් අපේක්ෂා කරනුයේ ද එවැනි අත්දැකීම්ය.


## LSD “good trip” experience

භීතිය ඇති කරවන, අප්‍රසන්න දර්ශන පෙන්නුම් කරන, ජීවිතය වේදනාකාරී බව හඟවන සහ නපුරු සහගත දර්ශන පෙන්නුම් කරන ආකාරයේ අත්දැකීම් මෙම ගණයට අයත් වේ. මෙවැනි අත්දැකීම් අත්විඳීමට භාවිත කරන්නන් අකමැති අතර ඒ සමග ඇතිවන ශාරීරික සංකූලතා හේතුවෙන් ඒ සම්බන්ධයෙන් ඔවුන් බියක් දක්වයි.

අධ්‍යයනය තුළ සම්මුඛ සාකච්ඡා පවත්වන ලද මත්ද්‍රව්‍ය භාවිතකරන පුද්ගලයින් 05 දෙනාගෙන් 04 දෙනෙකු ජීවිතයේ එක් අවස්ථාවක හෝ LSDභාවිතයත් සමග භීතිය ඇති කරවන ගණයේ අත්දැකීමට මුහුණ දී ඇත.

ඒ අතුරින් බහුතරයක් මුහුණ දී ඇති තත්ත්වය වන්නේ දෘශ්‍ය විකෘතීන් දැකීම වැනිතත්ත්වයකටයි. ඔවුන්ගේ අත්දැකීම් අනුව එහිදී බොහෝවිටසමාජශාලා පරිශ්‍රය තුළ දර්ශනය කර ඇති යම් ඡායාරූපයක්/දර්ශනයක් හෝ විදුලි ආලෝකකරණය මගින් ආලෝක වර්ණ රේඛා වෙනස් කිරීම මගින් භ්‍රාන්තීන් වලට පත්වීම හෝ ඒවා විකෘති සහගත රූප ලෙස දැකීම සිදුවී ඇත.

ඡායාරූප අංක 01-LSD “good trip” image



(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත, 2017)

ඡායාරූප අංක 02-LSD “bad trip” image



(මූලාශ්‍රය - අන්තර්ජාලය ඇසුරින්)

ඇතැම් LSDභාවිත කරන පුද්ගලයින් සිය ජංගම දුරකතන වල,LSDමඟින් සෞම්‍ය දර්ශන හා භීතියට පත්නොවන ආකාරයේ භ්‍රාන්තීන් ඇති කරවන ඡායාරූප ගබඩා කරගෙන සිටියි (ඉහත ඡායාරූප අංක 01 එවැනි පුද්ගලයකුගේ ජංගම දුරකථනයකින් ලබාගත් ඡායාරූපයකි).ප්‍රතිචාරකයින් පැහැදිළි කරන පරිදි LSDභාවිත කර ඇති අවස්ථාවල එම ඡායාරූප නරඹා තමන් අපේක්ෂා කරන භ්‍රාන්තිකාරක තත්ත්වයන්ට පත්වීම සිදුවෙයි. එමෙන්ම LSDභාවිත කරන්නන් ඔවුන්ගේ රුචිකත්වය අනුව සුවිශේෂීවූ LSDප්‍රභේද භාවිත කරයි. එම ප්‍රභේද අතරEcs, Shell, Burgas, Superman, Super Mario, Red bad man, Rock & Roll, Angel Qpid, Hoffman, Leach, Shiva, Hoffman blackයන වර්ග බහුලව භාවිතවන බව අධ්‍යයන දත්ත තුළින් අනාවරණයවිය. එමෙන්ම ඇතැම් අවස්ථා වල LSDභාවිත කිරීම මඟින්අපේක්ෂිත තෘප්තිය ලබාගැනීම හා වැඩි කරගැනීම සඳහා මද්‍යසාර වැනි ද්‍රව්‍යය ද ඒ සමඟ භාවිත කරනු ලබන බවට ඔවුන් විසින් ප්‍රතිචාර දක්වා ඇත.

### 3.2.4.3. ඇම්පිටමින් වර්ගයේ උත්තේජක

එක්සත්ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හාඅපරාධ පිළිබඳ කාර්යාලය(UNODC) විසින් 2015 දී පළකරන ලදAmphetamine type stimulants (ATS) use in India වාර්තාවට අනුව ඇම්පිටමින් වර්ගයේ උත්තේජක ඇම්පිටමින් කාණ්ඩයට අයත් ද්‍රව්‍ය වලින් සමන්විත වේ. ඇම්පිටමින් කාණ්ඩයට අයත් ද්‍රව්‍ය ගණයට ඇම්පිටමින්, මෙතම්පිටමින් සහ ඒවායෙන් ව්‍යුත්පන්න කරගත් ද්‍රව්‍යය එනම් මෙත්කැතිනොන්(Methcathinone), FentylineසහMethylphenidate අයත් වේ. එමෙන්ම මෙතම්පිටමින් ගණයට (පොදුවේ Speed, Ice, Crystal, Glass වශයෙන් හඳුන්වන) කෘතීම රසායනාගාර වල නිෂ්පාදනය කරන ද්‍රව්‍ය වේ.

ලෝක සෞඛ්‍යය සංවිධානය විසින් අර්ථදක්වන පරිදි ඇම්පිටමින් හා මෙතම්පිටමින් අඩංගු ඖෂධ වලින් සමන්විත කාණ්ඩයක් ලෙස ඇම්පිටමින් වර්ගයේ උත්තේජක හඳුන්වනු ලබයි. කෙසේවෙතත් Methcathinone, Fenetylline, Ephedrine, Pseudophedrine, Methylphenidate සහ MDMA හෙවත් Ecstasy යන ද්‍රව්‍යය ද මෙම කාණ්ඩයට අයත් වේ.

එක්ස්ටසි භාවිතය සම්බන්ධයෙන් ඉහත අනු මාතෘකාව යටතේ විශ්ලේෂණය කරන ලද අතර එක්ස්ටසි වලට අමතරව අධ්‍යයනය නියැදිය තුළනියෝජනය වූ පුද්ගලයින් විසින් භාවිත කර ඇති ඇම්පිටමින්හා මෙතම්පිටමින් වර්ගයේ ද්‍රව්‍යය පිළිබඳ පහත විග්‍රහ කර ඇත.

අධ්‍යයන දත්ත වලට අනුව නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් විසින් භාවිත කරනු ලබන මෙතම්පිටමින් වර්ගයේ ඖෂධ වර්ග “Ice”, “Crystal”සහ “Mendi”වශයෙන් හඳුනාගත හැකිය. එහිදී මෙතම්පිටමින් වර්ගයට ගැනෙනCrystal meth භාවිත කරන පුද්ගලයින් 04 දෙනෙක්, Iceයනුවෙන් හඳුන්වමින් මෙතම්පිටමින් භාවිත කරන පුද්ගලයින් 05 දෙනෙක් සහMendiයනුවෙන් හඳුන්වමින් මෙතම්පිටමින් ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් 28 දෙනෙක් හඳුනාගත හැකිවිය. ඇතැම් අවස්ථාවල එකම ද්‍රව්‍ය හැඳින්වීම සඳහා ඉහත නම් එකක් හෝ කිහිපයක් භාවිත කරනු ලබන අවස්ථා ද ඇත. බොහෝවිට ඔවුන් එවැනි ද්‍රව්‍ය ආඝ්‍රාණය කිරීම කරනු ලබයි.

### 3.2.4.4. කොකේන්


අධ්‍යයන නියැදියෙන් පුද්ගලයින් 28 දෙනෙක් කොකේන් භාවිත කරනු ලබයි. රාත්‍රී සමාජශාලා සාද වලට සහභාගී වීමේදී බාහිර කොකේන් අලෙවි කරන පුද්ගලයින්ගෙන් අවශ්‍ය ප්‍රමාණය රැගෙන යන අතර සාදවලදී මුණගැසෙන මිතුරන් සමඟ ඇතැම් අවස්ථා වල හුවමාරු කරගැනීම ද සිදුකරනු ලබයි.එමෙන්ම පුද්ගලයින් 14 දෙනෙක් “Charlie” නැමැති මත්ද්‍රව්‍ය විශේෂය ද භාවිත කරනු ලබයි. එයද කොකේන් ආශ්‍රිත නිෂ්පාදනයක් වන අතර කුඩු විශේෂයක් ලෙසින් සංසරණය වෙයි. ඒවා ආඝ්‍රාණය කිරීම බොහෝවිට සිදුකරනු ලබයි. Memidex ශබ්දකෝෂයට අනුව කොකා පත්‍ර (Coca leaves) මඟින් ලබාගන්නා මාදක ගණයේ ද්‍රව්‍යයක් වන අතර එය දැඩිලෙස ඇබ්බැහිකාරී ද්‍රව්‍යයකි. කොකේන් භාවිත කරන්නන් බොහෝවිට මෙම “Charlie” නැමැති මත්ද්‍රව්‍යය ද අවස්ථානුකූලව භාවිත කරනු ලබයි.

### 3.2.4.5. ඖෂධමය අරමුණු සඳහා භාවිත කරන ද්‍රව්‍ය අවභාවිතය

අධ්‍යයන අනාවරණ වලට අනුව සමස්ත නියැදියෙන් පුද්ගලයින් 26 (52%) දෙනෙක් විවිධ වර්ගයේ ඖෂධමය පෙති වර්ග භාවිත කර ඇත. ඔවුන් භාවිත කර ඇති ඖෂධ වර්ග පිළිබඳ සමස්තයක් ලෙස අවධානය යොමු කිරීමේ දී ඔවුන් සියලු දෙනාම වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරනු ලබන ඖෂධ වර්ග අවභාවිත කිරීම සිදුකර ඇත.

ඖෂධමය පෙති වර්ග භාවිත කරන පුද්ගලයින් 26 දෙනා අතර Pregabalinභාවිත කරන හතර දෙනෙක්,Diazepam භාවිත කරන නව දෙනෙක්, Tramadolභාවිත කරන 8 දෙනෙක්, Rohypnol භාවිත කරන එක් අයෙක්, Burbitone භාවිත කරන එක් අයෙක් සහ Psedoephidrine භාවිත කරන 10 දෙනෙක් හඳුනාගත හැකිවිය. බොහෝ පුද්ගලයින් අවස්ථානුකූලව පෙති වර්ග එකක් හෝ කිහිපයක් භාවිත කරනු ලබයි. මෙහිදී හඳුනාගත හැකි සුවිශේෂී කාරණය වන්නේ රාත්‍රී සමාජශාලා සාද වලදී මෙන්ම වෙනත් බාහිර අවස්ථාවන් වලදී ද ඔවුන් මෙවැනි ඖෂධමය පෙති වර්ග භාවිත කිරීමයි. පෙති වර්ග ලබාගැනීමේ දී ඔවුන් ඖෂධහල් හෝ වෙනත් පෙති වර්ග නීති විරෝධී ලෙස අලෙවි කරන පුද්ගලයින් මාර්ගයෙන් ලබාගැනීම සිදුකරයි.

ප්‍රස්ථාර අංක 06 -ඖෂධමය පෙති වර්ග භාවිත කරනු ලබන පුද්ගලයින්ගේ ව්‍යාප්තිය




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2017)

එන්නත් කරගැනීමේ චර්යාව සම්බන්ධයෙන් දත්ත දායකයින් අතර ඇති ප්‍රවණතාව පිළිබඳව අවධානය යොමු කරන ලද අතර පුද්ගලයින් 4 (8%) දෙනෙක් පමණක් හෙරොයින් එන්නත් කරගැනීම සිදුකර ඇත. නමුත් ඔවුන් දීර්ඝකාලීනව එන්නත් කරගන්නන් නොවන අතර අවස්ථානුකූලව හෙරොයින් එන්නත් කරගැනීම සිදුකර ඇත.


### 3.2.5. රාත්‍රී සමාජශාලා සාද වලදී භාවිත කිරීමට ප්‍රියකරන මත්ද්‍රව්‍ය වර්ග

ඉහත විග්‍රහ කරන ලද මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත පැතිකඩ සම්බන්ධ තොරතුරු වලට අමතරව දත්ත දායකයින් රාත්‍රී සමාජශාලා සාද වලදී භාවිත කිරීමට වඩාත්ම ප්‍රියකරන මත්ද්‍රව්‍ය වර්ග සම්බන්ධයෙන් ද අවධානය යොමුකරන ලදී. මෙහිදී Esctasy හා ඇම්පිටමින් වර්ගයේ උත්තේජක (ATS) මෙන්ම LSD වැනි ද්‍රව්‍ය ඔවුන් බොහෝවිට රාත්‍රී සමාජශාලා සාද වලදී භාවිත කරනු ලබයි.

නමුත් කොකේන්, ඖෂධමය පෙති වර්ග, ගංජා, හෙරොයින් වැනි ද්‍රව්‍ය සමාජශාලා සාද වල මෙන්ම ඉන් පරිබාහිර ස්ථාන හා අවකාශයන් වලදී ද අවස්ථානුකූලව භාවිත කරනු ලබයි.

එක් එක් මත්ද්‍රව්‍ය වර්ගය අනුව ඒවා රාත්‍රී සමාජශාලා වලදී භාවිත කිරීමට ඇති කැමැත්ත පිළිබඳ දත්ත දායකයින්ගේ මතය මෙහිදී විමසන ලද අතර ඒ සම්බන්ධයෙන් ඔවුන් පහත පරිදි ප්‍රතිචාර දක්වා ඇත. ඒ අනුව රාත්‍රී සමාජශාලා සාද අවස්ථා වල Esctasyභාවිත කිරීම සම්බන්ධයෙන් ඉහළරුචිකත්වයක් දක්වන පුද්ගලයින් 31 (62%) දෙනෙක් සහ LSDභාවිත කිරීමට ඉහළ රුචිකත්වයක් දක්වන පුද්ගලයින් 10 (20%) දෙනෙක් හඳුනාගත හැකිවිය. සමාජශාලා සාද අවස්ථාවල ඉහළ රුචිකත්වයක් සහිතව භාවිත කරන මත්ද්‍රව්‍ය ලෙස මෙහිදී Esctasyහඳුනාගත හැකිය. ඊට සාපේක්ෂව හෙරොයින්, ගංජා, කොකේන් සහ ඖෂධමය පෙති වර්ග වැනි ද්‍රව්‍ය රාත්‍රී සමාජශාලා සාද අවස්ථා වල භාවිත කිරීම සම්බන්ධයෙන් ඔවුන් ඉහළ රුචිකත්වයක් නොදක්වයි.

ප්‍රස්තාර අංක 07 - රාත්‍රී සමාජශාලා සාද අවස්ථා වල එක් එක් මත්ද්‍රව්‍ය වර්ග භාවිත කිරීම සඳහා පුද්ගලයින් දක්වන රුචිකත්වය




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2017)

මේ අනුව පැහැදිලි වන කරුණක් නම් Esctasyවැනි උත්තේජක ගණයේ ද්‍රව්‍ය භාවිතයට සහ ආලෝකකරණය හා සංගීතය සමඟ මායාකාරී අත්දැකීම් කරා ගමන් කිරීමට සමත් බලපෑමක් ලබාදෙන ද්‍රව්‍ය වර්ග භාවිතයටරාත්‍රී සමාජශාලා සාද වලට සහභාගී වන පුද්ගලයින් ඉහළ රුචිකත්වයක්දක්වන බවයි.

එමෙන්ම අධ්‍යයනය තුළ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සම්බන්ධයෙන් තවදුරටත් අවධානය යොමුකරන ලද අතර එහිදී ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සමාජශාලා සාදවලට පමණක් සීමා වන්නේ ද යන්න පිළිබඳව අධ්‍යයනය කරන ලදී. ඒ අනුව සමස්ත නියැදියෙන් බහුතර පුද්ගල සංඛ්‍යාවක් එනම් 27 (54%) දෙනෙක් සමාජශාලා සාද වලට අමතරව වෙනත් අවස්ථා වලදී

අදාළමත්ද්‍රව්‍ය වර්ග භාවිත කරනු ලබයි. එසේ මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබන වෙනත් ස්ථාන ලෙස සිය නිවස තුළ, වෙනත් හෝටලයකදී හෝ වෙනත් උත්සව හෝ සාද අවස්ථා දක්වන ලදී. ඒ අනුව පැහැදිළිවන කරුණක් නම් සමාජශාලා සාද වලට සහභාගී වී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් ඉන් පරිබාහිර වෙනස් ස්ථාන හෝ අවස්ථාවලදී ද සිය මත්ද්‍රව්‍ය භාවිතය සිදුකරන බවයි.

### 3.3රාත්‍රී සමාජශාලා සාදවල මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත පුද්ගල චර්යාවේ ස්වාභාවය

රාත්‍රී සමාජශාලා සාද සහ ඒ ආශ්‍රිත අවකාශයන් තුළ මත්ද්‍රව්‍ය භාවිතය සහ ඒ සමඟ සිදුවන පුද්ගල අන්තර්ක්‍රියාවන්ගේ ස්වභාවය පිළිබඳ මෙහිදී අවධානය යොමුකරන ලද අතර එය පහත උප ශීර්ෂ 04 යටතේ සාකච්ඡාවට භාජනය කර ඇත.

- ✦ සමාජශාලා සාදවලට යොමුවීම හා සහභාගීත්වය
- ✦ සමාජශාලා සාද සංවිධානයවන ආකාරය හා මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වන ආකාරය
- ✦ මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සිදුකරන ආකාරය
- ✦ මත්ද්‍රව්‍ය භාවිතය ඃ සෞඛ්‍යය හා සමාජ බලපෑම්

### 3.3.1. සමාජශාලා සාද වලට යොමුවීම හා සහභාගීත්වය

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් රාත්‍රී සමාජශාලා සාද වලට ප්‍රථම වරට සහභාගී වී ඇති වයස් මට්ටම් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පුද්ගලයින් 20 (40%) දෙනෙක් වයස අවුරුදු 18ට වඩා අඩු වඩා අඩු වයස් මට්ටමකදී ද, පුද්ගලයින් 13 (26%) දෙනෙක් වයස අවුරුදු 19-22 අතර වයස් මට්ටමකදී ද ප්‍රථම වරට සමාජශාලා සාද වලට සහභාගී වී ඇත. ඊට අමතරව පුද්ගලයින් 10 (20%) දෙනෙක් වයස අවුරුදු 23-26 අතර වයස් මට්ටමකදී ද රාත්‍රී සමාජ ශාලා වලට සහභාගී වීම ආරම්භ කර ඇත. සමස්ත නියැදියෙන් පුද්ගලයින් 49 (98%)දෙනෙක් වයස අවුරුදු 30ට වඩා අඩු වයස් මට්ටමක දී ප්‍රථම වරට රාත්‍රී සමාජශාලා සාද වලට සහභාගී වී ඇත.

ප්‍රථම වරට සමාජශාලා සාද වලට සහභාගී වීම පිළිබඳ තවදුරටත් අවධානය යොමුකිරීමේ දී පුද්ගලයින් 45 (90%) දෙනෙක් මිතුරන් සමඟ සමාජශාලා සාද වලට සහභාගී වී ඇත. ඊට අමතරව පුද්ගලයින් 2(4%) දෙනෙක් සිය සහකරුවා හෝ සහකාරිය සමඟ ප්‍රථම වරට සාද අවස්ථා වලට සහභාගී වී ඇත.

රාත්‍රී සමාජශාලා සාද වලට සහභාගී වන පුද්ගලයින්ගෙන් බහුතරයක් (49) දිනපතා එවැනි සාද වලට සහභාගී නොවන අතර පුද්ගලයින් 32 (64%) දෙනෙක් සති අන්ත දිනවල එවැනි සාද වලට සහභාගී වෙයි. ඊට අමතරව පුද්ගලයින් 8 (16%) දෙනෙක් සතියකට වරක් යම්කිසි අවස්ථාවක දීහා පුද්ගලයින් 7 (14%) දෙනෙක් වෙනත් විශේෂිත නිවාඩු දිනයන්හි දී සමාජශාලා සාද වලට සහභාගී වෙයි.

### 3.3.2. සමාජශාලා සාද සංවිධානය වන ආකාරය හා මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය කරන ආකාරය

#### 3.3.2.1. සමාජශාලා සාද සංවිධානය වන ආකාරය

සමාජශාලා, වෙනත් හෝටල්, සංචාරක නිකේතන සහ උත්සව ශාලා ආශ්‍රිතව මෙන්ම වෙරළාශ්‍රිත ප්‍රදේශ වල මෙවැනි සාද සංවිධානය කිරීම සිදුවෙයි. අධ්‍යයනයට සහභාගී වූ පුද්ගලයින් සහභාගී වන එවැනි සාද අවස්ථා සිදුවන ස්ථාන පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී දෙහිවල, ගල්කිස්ස, මොරටුව, කොල්ලුපිටිය, තිඹිරිගස්යාය, වාද්දූව, හික්කඩුව, මීගමුව වැනි ප්‍රදේශවල පැවැත්වෙන සාද වලට බහුතරයක් පුද්ගලයින් සහභාගී වී ඇත.

මෙවැනි සමාජ ශාලා සාද සහ වෙරළ සාද සංවිධානය කරනු ලබන වෙනම සංවිධායකයින් සිටින අතර එවැනි සාද ප්‍රවර්ධනය (Promote) කරන වෙනම කණ්ඩායමක්ද සිටියි. එහිදී රාත්‍රි සමාජශාලා හෝ වෙරළ සාද වලට සහභාගී වන පුද්ගල කණ්ඩායම් සමාජ මාධ්‍යය(Social media) හරහා සන්නිවේදනය කරගනු ලබයි. එම ඉලක්ක කණ්ඩායම අතර සාද පිළිබඳ විස්තර හා එක් එක් සාද හා අවස්ථා පිළිබඳ ආරාධනා යොමු කරනු ලබන්නේද සමාජ මාධ්‍යය විශේෂයෙන් Facebookගිණුම් භාවිත කරමිනි. සාද ප්‍රවර්ධනය කිරීම සඳහා වෙනම කණ්ඩායමක් ක්‍රියා කරන අතර Facebookසමාජ ජාලය තුළ නිර්මාණය කරගනු ලබන ව්‍යාජ Facebookගිණුම් (Fake Account)සහ අදාළ අවස්ථාවන් සඳහාම නිර්මාණය කරන ලද Facebookගිණුම් භාවිත කරමින් ආරාධනා සහ අදාළ විස්තර යොමු කරනු ලබයි. මෙහිදි සාද අවස්ථා ප්‍රවර්ධනය කරන පුද්ගලයින් අදාළ සාද සංවිධානය කරන පුද්ගලයින්ගේ තැරැව්කරුවන් වශයෙන් ක්‍රියා කරනු ලබයි.

ප්‍රවර්ධනය කරන පුද්ගලයින් විසින් කරනු ලබන ප්‍රවර්ධනය අනුව අදාළ සාදයට සහභාගී වන පුද්ගල සංඛ්‍යාව තීරණය වන අතර ඒ අනුව අදාළ පුද්ගලයින්ට ප්‍රවර්ධනය වෙනුවෙන් ගෙවීම් කිරීම හෝ ඇතැම් අවස්ථාවල නොමිලේ ප්‍රවේශපත්‍ර ලබාදීම සිදුකරයි.

අධ්‍යයනය තුළ සිදු කරන ලද ප්‍රත්‍යක්ෂ අධ්‍යයනවලට අනුව රාත්‍රි සමාජශාලා සාද වලට සහභාගී වන පුද්ගලයින් ඇතැම් අවස්ථාවල සාද ප්‍රවර්ධනය කරන්නන් ලෙස කටයුතු කරනු ලබයි. මන්ද ඔවුන් නොමිලේ ලැබෙන ප්‍රවේශපත්‍ර ලබාගැනීමේ අරමුණින් අදාළ සාද ප්‍රවර්ධන කටයුතු වල යෙදී සිටියි. (ප්‍රත්‍යක්ෂ අධ්‍යයන දත්ත). ප්‍රත්‍යක්ෂ අධ්‍යයන දත්ත වලට අනුව අනුව සාද අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීමේදි සළකා බලනු ලබන නැතිනම් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබන ප්‍රධාන කරුණු කිහිපයක් ඇත.

- පැවැත්වෙන ස්ථානය
- සංගීතය සපයන කණ්ඩායම හෝ සහභාගී වන කලාකරුවන් (DJ Artist)
- අදාළ පැකේජයට (Package) ඇතුළත් විශේෂාංග හා මිල ගණන්
- මත්ද්‍රව්‍ය භාවිත කිරීමට ඇති අවකාශය හා එවැනි පසුබිමක් හඟවන සුවිශේෂි වචන හෝ පින්තූර


මෙවැනි අංග හරහා පුද්ගලයින් අදාළ අවස්ථාවන්ට ආකර්ෂණය කරගැනීම සඳහා ඔවුන් උත්සාහ කරනු ලබයි. බොහෝ සාද අවස්ථාවන් වල එකම පිරිසක් සහභාගි වන අතර අදාළ පුද්ගලයින් අතරද සමාජ මාධ්‍යය හරහා ගොඩනගාගත් සම්බන්ධතාවයන් පවත්වා ගෙන යනු ලබයි. විශේෂයෙන් Facebook ගිණුම් හරහා නිර්මාණය කරගත් සමීප කණ්ඩායම් (Close Group)මගින් පැවැත්වෙන සාද අවස්ථා පිළිබඳ විස්තර හුවමාරු කර ගනියි. බොහෝ රාත්‍රි සමාජශාලා සාද වල අවස්ථා නැතිනම් අදියර දෙකක් ඇත. එනම්,

- ❖ Night Party
- ❖ After Party

වශයෙනි. "Night Party"රාත්‍රියේ ආරම්භවී පසුදින උදෑසන දක්වාම පැවැත්වෙයි. එම අවස්ථා තුළ ඉහළ ඉල්ලුමක් ඇති සංගීත ප්‍රභේද වාදනය කරන අතර ප්‍රවීණ ගණයේ ශිල්පින් සහභාගී වෙයි. "After Party"යනු රාත්‍රිය පුරා පැවැති සාදය අවසන්ව පසුදින උදෑසන සිට ආරම්භවී දිවා කාලය දක්වා පැවැත්වෙන අවස්ථාවන්ය. ඒවායේද රාත්‍රියේ පැවැත්වෙන සාද වලට සමාන තත්ත්වයක් දැක ගත හැකි අතර සංගීතය බොහෝ විට වෙනස්කම් වලට ලක් කරයි. එම අවස්ථා තුළද මත්ද්‍රව්‍ය වර්ග භාවිත කිරීම සිදු කරනු ලබන බව අධ්‍යයන තුළින් අනාවරණය විය. රාත්‍රි සාද වලට සහභාගී වන තරුණ කණ්ඩායම් ඇතැම් අවස්ථාවල එම සාදය අවසන් වු පසු අදාළ හෝටලය තුළ හෝ වෙනත් ස්ථානයක කාමරයක් කුලී පදනම මත ලබාගෙන නවාතැන් ගනියි. මෙය අදාළ උප සංස්කෘතික පසුබිම තුළ"Roomදානවා" යනුවෙන් ඔවුන් විසින් හඳුන්වනු ලබයි. එසේ නවාතැන් ගන්නා අවස්ථා වලද මෙම කණ්ඩායම් විසින් මත්ද්‍රව්‍ය භාවිත කිරීම සිදුකරනු ලබයි. එහිදී බොහෝ විට මද්‍යසාර, සිගරැට්, ගංජා, LSDවැනි ද්‍රව්‍ය භාවිත කරනු ලබයි. මෙහිදී පැහැදිළි වන කරුණක් නම් මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ප්‍රමුඛත්වයක් ලබාදෙමින් රාත්‍රි සමාජශාලා සාද සංවිධානය වන බවයි.

සාද වලට සහභාගි වන පුද්ගලයින් එවැනි සමාජශාලා පරිශ්‍රයන් වල සිදුවන විවිධ ක්‍රියාකාරකම් වලටද සම්බන්ධ වෙයි. අධ්‍යයන නියැදියෙන් බහුතරයක් සංගීතමය හා නර්තන අවස්ථා වලට සම්බන්ධ වී ඇත.

ප්‍රස්තාර අංක 08 - රාත්‍රි සමාජ ශාලා වලට යොමුවන පුද්ගලයින් සහභාගි වන විවිධ අවස්ථා




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2017)

ඉහත දත්ත අනුව බහුතර පුද්ගල සංඛ්‍යාවක් නර්තන හා සංගීත අවස්ථාවන්ට සහභාගි වන අතර පුද්ගලයින් 17 (34 %) දෙනෙක් ලිංගික සහකරුවන් හා සහකාරියන් ආශ්‍රය කිරීමේ අවස්ථාවක් ලෙස භාවිත කර ඇත.

ඒ අතුරින් අදාළ පුද්ගලයින් විසින් වැඩි රුචිකත්වයක් දක්වන අවස්ථා සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේ දී පුද්ගලයින් 23 (46%) දෙනෙක් සංගීතමය අවස්ථාවන්ට වඩාත් ප්‍රිය කරන අතර පුද්ගලයින් 07 (14%) දෙනෙක් නර්තනයේ යෙදීම සම්බන්ධයෙන් වැඩි රුචිකත්වයක් දක්වන බවට ප්‍රතිචාර දක්වා ඇත. එමෙන්ම පුද්ගලයින් 06 (12%) දෙනෙක් ලිංගික සහකරුවන් හෝ සහකාරියන් සමග සම්බන්ධ වීමට වැඩි රුචිකත්වයක් දක්වයි. පොදුවේ ඔවුන් සියලු දෙනාම එවැනි සාද අවස්ථාවල මත්ද්‍රව්‍ය භාවිතය සිදුකරනු ලබයි.

### 3.3.2.2. මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වන ආකාරය හා මිත්‍යා මත

ඉහත පරිච්ඡේදය තුළ සාකච්ඡා කරන ලද කරුණු වලට අනුව රාත්‍රි සමාජශාලා සාද වලට සහභාගි වන පුද්ගලයින් විවිධ වර්ගයේ මත්ද්‍රව්‍ය වර්ග භාවිත කරනු ලබයි. මෙහිදි සාද අවස්ථාවන්ට සුවිශේෂි වන්නේ යැයි අදාළ පුද්ගලයින් විසින්ම තීරණය කරන ලද මත්ද්‍රව්‍ය වර්ගද ඔවුන් මෙහිදි භාවිත කරනු ලබයි. එමෙන්ම ඔවුන්ට එවැනි මත්ද්‍රව්‍ය වර්ග භාවිත කිරීමට සහ එම මත්ද්‍රව්‍ය ශරීර ගත කරගැනීම තුළ ඔවුන් අපේක්ෂා කරන තෘප්තිය වඩාත් තීව්‍ර කර ගැනීම සඳහා විවිධ සංගීතමය ප්‍රභේදයන්ද ඔවුන් විසින් නිර්ණය කරගෙන ඇත.

එමෙන්ම නර්තනයේ යෙදීමට සහ එකනෙකා අතර සුහදතාවය වර්ධනය කරගැනීම සඳහා ඔවුන් මෙසේ මත්ද්‍රව්‍ය භාවිත කර නර්තනයේ යෙදෙන බව ඔවුන් විශ්වාස කරනු ලබන මතයයි. නමුත් මේ

තුළ ගැබ්ව ඇති මිත්‍යාව ඔවුන්ට අවබෝධ නොවන අතර සමවයස් සමූහ තුළ එය තවදුරටත් සාධාරණීකරණය කර ගනිමින් මෙවැනි චර්යාවන් දිගටම පවත්වා ගෙන යනු ලබයි.

මෙවැනි සාද අවස්ථාවල මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් සංගීතය, නර්තනය (Electronic Dance and Music - EDM)සහ අලෝකකරණය භාවිත කරනු ලබයි. බොහෝ විට බටහිර ශෛලියට අයත් ගීත පරිගණක අනුසාරයෙන් හෝ Synthesizersමගින් ඝෝෂාකාරී සහ අඛණ්ඩව වාදනය වන සංගීත ඛණ්ඩ ලෙස වාදනය කරන අතර ඒ අනුව නර්තනයේ යෙදෙන අතරතුර අදාළ මත්ද්‍රව්‍ය භාවිතයත් සමග මුඛය තුළ ඇතිවන වියළිබව මගහරවා ගැනීමට හෝ තෘප්තිය වැඩි කර ගැනීමේ අරමුණින් පැණි රස ටොෆි වර්ග කෑම සිදුකරයි. (සහභාගී නිරීක්ෂණ දත්ත)

මෙවැනි සාද වලට සහභාගි වී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සිය මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් දක්වන ලද අදහස් හා හේතූන් සංක්ෂිප්ත ලෙස පහත දක්වා ඇත.

- වැඩි වේලාවක් නර්තනයේ යෙදීම සඳහා මත්ද්‍රව්‍ය භාවිත කරයි
- යහළුවන් හඳුනා ගැනීම සහ සබඳතා ගොඩනගා ගැනීම සඳහා මත්ද්‍රව්‍ය භාවිත කරයි
- සතුට, විනෝදය වැනි හැඟීම් හා චිත්තවේග ඇති කරගැනීම සඳහා භාවිත කරයි
- සමාජශාලා තුළ මත්ද්‍රව්‍ය භාවිත කිරීම කිසිවෙකුගේ අවධානයට ලක් නොවීම
- සතියකට වරක් එවැනි සාදයකට ගොස් මත්ද්‍රව්‍ය භාවිත කිරීම කිසිදු ගැටලුවක් නොවන බව විශ්වාස කිරීම

ඉහත අදහස් විශ්ලේෂණය කිරීමේදී ඒ සියල්ලම එක් පොදු තේමාවක් යටතට ගොනු කළ හැකිය. එනම් මත්ද්‍රව්‍ය භාවිතය හා එහි බලපෑම සම්බන්ධයෙන් පුද්ගලයින් තුළ පවත්නා අනවබෝධය හා මිත්‍යා විශ්වාසයන්ය. නිරාවරණ ක්‍රියාකාරකම් තුළ මෙවැනි මිත්‍යා මත නිශේධනය කිරීම සඳහා අවධානය යොමු කිරීම වැදගත්ය.

එමෙන්ම මෙම මිත්‍යා මත වල සිට මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් ඔවුන් උප සංස්කෘතික කණ්ඩායමක් ලෙස සලකනු ලබයි. සාද වලට සහභාගි වීම, ඒවායෙහි මත්ද්‍රව්‍ය භාවිත කිරීම වැනි ක්‍රියාකාරකම් සඳහා සමාජ මාධ්‍ය හරහා ඔවුන් සංවිධානය වන අතර එක් එක් මත්ද්‍රව්‍ය වර්ග සඳහා මෙන්ම අවස්ථා සදහා උප සංස්කෘතික වචන හා යෙදුම් භාවිත කරනු ලබයි.

වගු අංක 06 - එක් එක් මත්ද්‍රව්‍ය වර්ගය හැඳින්වීම සඳහා රාත්‍රි සමාජශාලා සාද වල භාවිත වන යෙදුම්

| මත්ද්‍රව්‍ය වර්ගය | රාත්‍රි සමාජශාලා වල භාවිත වන නාම හෝ යෙදුම් |
|---|---|
| Ecstasy | Phill |
| LSD | Acid/ කොළ/Stamp |
| හෙරොයින් | පැන්/ බව්වා |
| ගංජා | Joint |
| කොකේන් | White Bair |
| මෙතම්පිටමින් | Ice/ Mendi |


(මුලාශ්‍රය - පර්යේෂණ දත්ත - 2017)

එවැනි උප සංස්කෘතික වචන භාවිත කිරීම හරහා ඔවුන් යම් අනන්‍යතාවයන් ගොඩනගා ගැනීමට උත්සාහ දරන අතර අදාළ කණ්ඩායම අතර අන්තර්ක්‍රියා කිරීමද සිදුකරයි.

### 3.4. මත්ද්‍රව්‍ය මිලදීගැනීම සිදුකරන ආකාරය

සමාජශාලා සාද වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් අදාළ මත්ද්‍රව්‍ය වර්ග මිලදී ගනු ලබන ක්‍රමවේද පිළිබඳ මෙහිදී අධ්‍යයනය කරන ලද අතර එහිදී විවිධ මාර්ග ඔස්සේ ඔවුන් මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සිදුකරනු ලබයි. අධ්‍යයන දත්ත වලට අනුව පුද්ගලයින් 31 (62%) දෙනෙක් රාත්‍රී සමාජශාලාවෙන් හෝ වෙරළසාද පැවැත්වෙන පරිශ්‍ර වලින් මත්ද්‍රව්‍ය මිලදී ගනු ලබන අතර ඉන් පැහැදිළිවන කරුණක් නම් එවැනි ස්ථාන වලට සහභාගී වන පුද්ගලයින් සඳහා මත්ද්‍රව්‍ය අලෙවි කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන බවයි.

ප්‍රස්තාර අංක 09 - මත්ද්‍රව්‍ය මිලදී ගනු ලබන මූලාශ්‍රයන්




(මුලාශ්‍රය - පර්යේෂණ දත්ත - 2017)


ඉහත ප්‍රස්ථාරයට අනුව පුද්ගලයින් 29 (58%) දෙනෙක් බාහිර මත්ද්‍රව්‍ය අලෙවි කරන පුද්ගලයින් මඟින් ද, පුද්ගලයින් 28 (56%) දෙනෙක් සමාජශාලාවට පැමිණෙන මිතුරන්මඟින් ද මත්ද්‍රව්‍ය මිලදී ගනු ලබයි. සම්මුඛ සාකච්ඡා දත්ත මඟින් ද තහවුරු වන ආකාරයට ප්‍රධාන වශයෙන් මූලාශ්‍ර 03 මඟින් ඔවුන් මත්ද්‍රව්‍ය මිලදී ගනු ලබයි. එනම්,

- සමාජශාලා හෝ වෙරළ සාද පැවැත්වෙන පරිශ්‍ර තුළමත්ද්‍රව්‍ය අලෙවි කරන පුද්ගලයින්ගෙන්
- බාහිර මත්ද්‍රව්‍ය අලෙවි කරන පුද්ගලයින්ගෙන්
- සාද වලට සහභාගී වන මිතුරන් මඟින් වශයෙනි.

බොහෝවිට මෙවැනි සාද සංචාරක හෝටල් හෝ එවැනි වෙනත් අවන්හල් ආශ්‍රිතව පැවැත්වෙන අවස්ථාවලදී මද්‍යසාර හා සිගරැට් ආදිය අදාළ පරිශ්‍රවල සිටම අලෙවි කරනු ලබයි. එය ප්‍රසිද්ධියේ සිදුවූවද හෙරොයින් හෝ ගංජා වැනි මත්ද්‍රව්‍ය වර්ගද මෙවැනි පරිශ්‍රවල අලෙවිවන අතර එය ප්‍රසිද්ධියේ සිදුනොවන අතර ගොඩනගාගත් සබඳතා මත සිදුවේ. එනම් එවැනි මත්ද්‍රව්‍ය වර්ග මිලදී ගැනීමට නම් යම් සබඳතාවයක් ගොඩනගාගෙන සිටිය යුතුය.

අදාළ පුද්ගලයින් මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වැය කරන මුදල් ප්‍රමාණය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පුද්ගලයින් 29 (59%)දෙනෙක් රු. 20,000ට අඩු මුදලක් මසකට මත්ද්‍රව්‍ය සඳහා වියදම් කරනු ලබයි. ඊට අමතරව පුද්ගලයින් 9 (12%) දෙනෙක් රු. 30,000- රු. 40,000 අතර මුදලක් මාසිකව වැය කරනු ලබයි.

ප්‍රස්තාර අංක 10- රාත්‍රී සමාජශාලා සාද/ වෙරළ සාද වලට සහභාගී වන පුද්ගලයින් මත්ද්‍රව්‍ය සඳහා මාසිකව වැය කරන මුදල් ප්‍රමාණය




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත - 2017)

ඉහත ප්‍රස්ථාරය අනුව රු. 40,000 - 50,000 අතර මුදලක් වියදම් කරන පුදගලයින් තිදෙනෙක් සහ රු. 50,000ට වැඩි මුදලක් මාසිකව වියදම් කරන පුද්ගලයින් දෙදෙනෙක් ද අධ්‍යයනය තුළ හඳුනාගත හැකිය. සමාජශාලා සාද වලට සහභාගී වන පුද්ගලයින් මත්ද්‍රව්‍ය සඳහා මාසිකව වියදම් කරන මුදල් ප්‍රමාණය මෙන්ම එම මුදල් මත්ද්‍රව්‍ය ලබාගැනීමේ දී වැය කරන ආකාරය ද අධ්‍යයනයට ලක්කරන ලදී.

ඒ අනුව පුද්ගලයින් 38 (76%) දෙනෙක් පෞද්ගලිකව මුදල් ගෙවීමෙන් සහ පුද්ගලයින් 37 (74%)දෙනෙක් යහලුවන් සමඟ මුදල් හුවමාරු කර ගනිමින් ද මත්ද්‍රව්‍ය මිලදී ගනු ලබයි. ඊට අමතරව පුද්ගලයින් 4 (8%) දෙනෙක් ණයට හෝ පසුව ගෙවීමේ එකඟතාවය මතද එක් පුද්ගලයෙක් තම ලිංගික සහකරුවා හෝ සහකාරිය වෙත ලිංගික වශයෙන් අල්ලස් ලබාදීමෙන් ද මත්ද්‍රව්‍ය මිලදී ගනු ලබයි. අධ්‍යයනය තුළ මත්ද්‍රව්‍ය සඳහා ලිංගිකත්වය (Sex for drug) සැපයීම පිළිබඳව අධ්‍යයනය කරන ලද අතර එහිදී රාත්‍රී සමාජශාලා සාද අතරතුර ලිංගික සහකරුවන්, සහකාරියන් සමඟ එක්වීම සිදුකළ ද මත්ද්‍රව්‍ය ලබාගැනීමේ අරමුණින් නැතිනම් මත්ද්‍රව්‍ය සඳහා අල්ලසක් වශයෙන් ලිංගික ක්‍රියාකාරකම් වල නිරතවීමේ ප්‍රවණතාවක් හඳුනාගත නොහැකි විය.

ඉහත සඳහන් කරන ලද පෞද්ගලික මුදල් යෙදවීමෙන් මත්ද්‍රව්‍ය මිලදීගනු ලබන පුද්ගලයින් තමන්ට අවශ්‍ය මුදල් උපයන මාර්ග පිළිබඳ අවධානය යොමුකිරීමේ දී පුද්ගලයින් 33 (66%) දෙනෙක් රැකියාවේ නිරත වීමෙන් ලැබෙන ආදායමෙන් ද පුද්ගලයින් 12 (24%) දෙනෙක් දෙමාපියන්ගෙන් ලැබෙන මුදල් වලින් ද, පුද්ගලයින් 16 (32%) දෙනෙක් වෙනත් පුද්ගලයින්ට මත්ද්‍රව්‍ය සැපයීමෙන්

ලැබෙන මුදලින් ද මත්ද්‍රව්‍ය සඳහා අවශ්‍ය මුදල් සපයාගෙන ඇත. මෙහිදී අවධානයට ලක්වන තවත් වැදගත් කරුණක් නම් ඇතැම් පුද්ගලයින් (අධ්‍යයන අනාවරණයන්ට අනුව පුද්ගලයින් 16 දෙනෙක්) මත්ද්‍රව්‍ය අලෙවි කරන පුද්ගලයින්ගෙන් වෙනත් පුද්ගලයින්ට මත්ද්‍රව්‍ය අලෙවි කිරීමේ දී මැදිහත්කරුවන් වශයෙන් ක්‍රියා කිරීමෙන් යම් ආදායමක් උපයනු ලබයි. එහිදී බොහෝවිට මත්ද්‍රව්‍ය සැපයීම හරහා ලැබෙන කොමිස් මුදලක් මඟින් ඔවුන් තමන්ට දෛනිකව අවශ්‍ය මත්ද්‍රව්‍ය මිලදී ගනු ලබයි.

සමාජශාලා සාද වලට සහභාගී වීම සඳහා ප්‍රවේශ පත්‍රයක් මිලදී ගතයුතු අතර පුද්ගලයින් බහුතරයක් (80%)සාමාන්‍ය ප්‍රවේශ පත්‍ර මිලදී ගනු ලබන අතර ඇතැම් අවස්ථා වල නොමිලේ ඇතුළු විය හැකි ප්‍රවේශ පත්‍ර ද අවිධිමත් මාර්ග හරහා ලබාගනියි. බොහෝ අවස්ථා වල ප්‍රවේශ පත්‍රය මඟින් අදාළ සාද අවස්ථාවට ඇතුළු වීමට පමණක් හැකි අතර ප්‍රවේශ පත්‍රයේ ස්වභාවය අනුව එය වෙනස් වන අවස්ථා ද ඇත. එනම් මද්‍යසාර ලබාගත හැකි හෝ කාමර පහසුකම් ලබාගත හැකි අවස්ථා ද ඇතැම් වර්ගයේ ප්‍රවේශ පත්‍ර වලට ඇතුළත් කර ඇත. ඒ අනුව රාත්‍රී සමාජශාලා සාදයකට හෝ වෙරළ සාදයකට සහභාගී වන පුද්ගලයෙක් ඇතුළුවීමේ ප්‍රවේශ පත්‍රය සඳහා සහ මත්ද්‍රව්‍ය ලබාගැනීම සඳහා මුදල් වැය කළ යුතුය.

### 3.5. මත්ද්‍රව්‍ය භාවිතය : සෞඛ්‍යය හා සමාජ බලපෑම්

දීර්ඝකාලීන මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිඵලයක් වශයෙන් පුද්ගලයින් සෞඛ්‍ය හා සමාජමය අර්බුදකාරී තත්ත්වයන්ට මුහුණ දීම සුලභ සංසිද්ධියක් බව ප්‍රතිකාර ලබාගැනීම පිළිබඳ දත්ත වාර්තා සහ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධ පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තා මඟින් තහවුරු වී ඇත. මෙම අධ්‍යයනය තුළ ප්‍රධාන වශයෙන් රාත්‍රී සමාජශාලා වැනි අවකාශවල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් මුහුණපා ඇති සෞඛ්‍ය හා සමාජමය අවදානම් සහගත තත්ත්වයන් පිළිබඳ අවධානය යොමුකරන ලදී.

අධ්‍යයනය කරන ලද නියැදියෙන් පුද්ගලයින් 31 (62%) දෙනෙක් කෙදිනක හෝ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් යම් ශාරීරික අපහසුතාවන්ට (Physical discomfort)ලක්වී ඇති බව අනාවරණය විය. එහිදී ඇතැම් පුද්ගලයින් LSD භාවිත කිරීම හේතුවෙන් ඇති වූ bad trip ගණයේ අත්දැකීම් සමඟ ඇතිවන හිසරදය, කැරකිල්ල හා ක්ලාන්ත වීම වැනි තත්ත්වයන්ට මුහුණ දී ඇත. ඊට අමතරව හුස්ම ගැනීමේ අපහසුතා, සිහිමූර්ජා වීම වැනි තත්ත්වයන්ට පත්වූ පුද්ගලයින් ද අධ්‍යයනය තුළ ප්‍රතිචාර දක්වා ඇත.

මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ඔවුන් මුහුණ දී ඇති එවැනි ශාරීරික අසංකූලතා අධිමාත්‍රා වීමට අදාළරෝග ලක්ෂණයන්ට බොහෝ සෙයින් සමානකමක් දක්වයි. ලෝක සෞඛ්‍ය සංවිධාන නිර්වචන වලට අනුව අධිමාත්‍රික වීමට අදාළලක්ෂණයන් විශ්ලේෂණය කිරීමේ දී අධිමාත්‍රාව තුළ සිහිමූර්ජාව හෝ සිහි විකල් බව ඇති කරන ප්‍රමාණය ඉක්මවා මත්ද්‍රව්‍ය ගැනීම හෝ විවිධ මත්ද්‍රව්‍ය එකට මිශ්‍ර කර ගැනීම සිදුවෙයි. පොදුවේ මෙවැනි අවස්ථා වල හුස්මගැනීමේ අපහසුතාවය, දෙතොල් නිල්පැහැ වීම, ඇසේ කළු ඉංගිරියාව/දෑස සංකෝචනය වීම වැනි ලක්ෂණ මතුවේ. මෙම අධ්‍යයනය තුළ පුද්ගලයින් විසින් දක්වන ලද සංකූලතා පිළිබඳඉහත නිර්වචනයට අනුව නිර්ණය කිරීමේදීඇතැම් අවස්ථා වල ඔවුන් අධිමාත්‍රික තත්ත්වයට ද පත්ව ඇති බව නිර්ණය කළ හැකිය.

අදාළ පුද්ගලයින් එවැනි අපහසුතාවන්ට හෝ අසංකුලතාවන්ට පත්වීම සඳහා බලපාන ලද මත්ද්‍රව්‍ය වර්ග පිළිබඳ අවධානය යොමුකිරීමේ දී මද්‍යසාර සහ පෙති වර්ග වැනි ද්‍රව්‍ය හේතුවෙන් ප්‍රධාන වශයෙන් ඔවුන් ශාරීරික අසංකුලතාවන්ට ලක්ව ඇත.

### 3.5.1. මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා ප්‍රතිකාර ලබාගැනීම

මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ක්‍රියාත්මක වන අතර අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 15 (30%) දෙනෙක් මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වයෙන් සුවවීම සඳහා කෙදිනක හෝ ප්‍රතිකාර ලබාගෙන ඇත. එසේ ප්‍රතිකාර සේවාවන් ලබාගැනීමේ දී අදාළපුද්ගලයින් විවිධ ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් සපයන ආයතන වලට යොමු වී ඇත. පුද්ගලයින් දෙදෙනෙක් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අයත් ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින්, පුද්ගලයින් 08 දෙනෙක් රාජ්‍ය නොවන ආයතන මඟින් ක්‍රියාත්මක වන ප්‍රතිකාර වැඩසටහන් වලින් සහපුද්ගලයින් 04 දෙනෙක් පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන හෝ වෙනත් ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින්මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා ප්‍රතිකාර ලබාගෙන ඇත.

### 3.5.2. සමාජ අපගාමී ක්‍රියාවලට දක්වන දායකත්වය

රාත්‍රී සමාජශාලා සාද ආශ්‍රිත අවකාශ වල මත්ද්‍රව්‍ය භාවිත කිරීම හා සම්බන්ධවපුද්ගලයින් මැදිහත්වන වෙනත් අපගාමී ක්‍රියාවන් සහ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට පත්වීම් සම්බන්ධයෙන් ද අවධානය යොමුකරන ලද අතර අධ්‍යයන නියැදියෙන් පුද්ගලයින් 22 (44%) දෙනෙක් තුළ කෙදිනක හෝ සමාජශාලා සාද අවස්ථා වල සිදුවූ කැරලි, කෝලාහල, ගැටලුකාරී තත්ත්ව, අපරාධ ක්‍රියා වැනි සංසිද්ධීන් සම්බන්ධයෙන් අත්දැකීම් ඇති බව අනාවරණය කර ඇත. එවැනි සංසිද්ධීන් සඳහා මත්ද්‍රව්‍ය භාවිතය හේතුවක් වී ඇත්ද යන කරුණ පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පුද්ගලයින් 20 (40%) දෙනෙක් එවැනි ගැටලුකාරී තත්ත්ව සඳහා ඍජුවම හෝ වක්‍රව මත්ද්‍රව්‍ය භාවිතය හේතු වී ඇති බවට විශ්වාස කරනු ලබයි. මේ අනුව පැහැදිළිවන කරුණක් නම් සමාජශාලා අවකාශවල මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් විවිධසමාජ විරෝධී හා අපගාමී ක්‍රියාවන් සිදුවන බවයි.

එමෙන්ම අධ්‍යයන නියැදිය තුළනියෝජනය වූ පුද්ගලයින්ගෙන් 19 (38%) දෙනෙක් කෙදිනක හෝ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදිකරුවකු බවට පත්වී ඇති අතර ඔවුන් විවිධ වැරදි යටතේ වරදකරුවන් බවට පත්වී ඇත. පුද්ගලයින් 14 දෙනෙක් මත්ද්‍රව්‍ය ළඟ තබාගැනීම යටතේ සහ පුද්ගලයින් සිව් දෙනෙක් මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම යටතේ නීතියෙන් වැරදිකරුවන් බවට පත්වී ඇත. ඊට අමතරව තවත් පුද්ගලයින් 04 දෙනෙක් මත්ද්‍රව්‍ය අලෙවි කිරීමේ වරදට වැරදිකරුවන් බවට පත්ව ඇත. මේ අනුව පැහැදිළිවන කරුණක් නම් රාත්‍රී සමාජශාලා සාදවල මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් පුද්ගලයින් සෞඛ්‍යමය හා සමාජමය ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවන බවයි.

**සාකච්ඡාව**

රාත්‍රී සමාජශාලා හා වෙරළ සාදවල මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද මෙම අධ්‍යයනය තුළ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සුවිශේෂී කරුණු කිහිපයක් සාකච්ඡාවට භාජනය කර ඇත. ගෝලීය සන්ධර්භය තුළ වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ට සාපේක්ෂව රාත්‍රී සමාජශාලාවල ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය බහුලව භාවිත කරන පුද්ගලයින්ගේ වෙනස්කම් හා අනන්‍ය වූ ලක්ෂණ විවිධ අධ්‍යයන මඟින් තහවුරු කරගෙන ඇත. උක්ත පරිච්ඡේද වල සාකච්ඡා කළ අන්දමට කොළඹ නගරය හා අනෙකුත් උපනාගරික කලාප ආශ්‍රයෙන් සිදුකරන ලද මෙම අධ්‍යයනය තුළින් ද ගෝලීය මට්ටමේ අධ්‍යයන වලින් අනාවරණය කරගෙන ඇති තත්ත්වයන් සහ සාධක නැවත සනාථ වී ඇත.

විශේෂයෙන්ම අධ්‍යයන අනාවරණයන්ට අනුව රාත්‍රී සමාජශාලා සාදවල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ට සාපේක්ෂව බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග භාවිත කරනු ලබයි. අනෙකුත් අධ්‍යයන වලින් තහවුරු වන ආකාරයට වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් වීදි මට්ටම තුළ පහසුවෙන් ලබාගත හැකි මත්ද්‍රව්‍ය හා මද්‍යසාර වර්ග වලට සීමා වීම බොහෝවිට සිදුවන නමුත් සමාජශාලා වැනි ආවරණය වූ පරිශ්‍ර වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් වීදි මට්ටම තුළ පහසුවෙන් ලබාගත හැකි ද්‍රව්‍ය මෙන්ම සමාජශාලා සාදවල සංසරණය වන ද්‍රව්‍ය වර්ග ලබාගැනීමට ද යොමු වී ඇත. අධ්‍යයනයේ දත්ත දායකයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වාභාවය පිළිබඳ පූර්ව පරිච්ඡේද වල ඉදිරිපත් කරන ලද කරුණු අනුව එය වැඩිදුරටත් සනාථ කරගත හැකිය.

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් බහුතරයක් වයස අවුරුදු 25ට අඩු පුද්ගලයින් වූ අතර ඔවුන් ඉතා අඩු වයස් මට්ටම් වලදී මත්ද්‍රව්‍ය භාවිතයට සහ රාත්‍රී සමාජශාලා සාද වලට සහභාගී වීමට යොමු වී ඇත. තරුණ වයසේ පුද්ගලයින් සමාජශාලා සාද වලට මත්ද්‍රව්‍ය භාවිත කිරීමට නැතිනම් ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය හෝ පොදුවේ “Party drugs”ගණයට අයත් ද්‍රව්‍ය භාවිත කිරීම ගෝලීය මට්ටමේ වෙනත් අධ්‍යයන මඟින් ද තහවුරු කරන ලද ප්‍රවණතාවයකි.

මෙම අධ්‍යයනය තුළින් ද තහවුරු වූ ආකාරයට තරුණ වයසේ පුද්ගලයින් වෙනත් විවිධ ආකර්ශණීය සාධක හා සමාජ මාධ්‍ය හරහා සංවිධානය වීම තුළ මෙවැනි සාද වලට සහභාගී වීම විලාසිතාවක් බවට පත් කරගෙන ඇත. අධ්‍යයනය තුළින් අනාවරණය වූ ආකාරයට පුද්ගලයින් ඉහළ වශයෙන් සමාජශීලීත්වය ඇතිකර ගැනීමේ අරමුණින් සාද වලට සහභාගී වීම සිදුකරන අතර එවැනි සාදවල සිය මිතුරු සමූහ සමඟ අන්තර්ක්‍රියා කිරීමේදී මත්ද්‍රව්‍ය භාවිතය එක් ක්‍රමයක් බවට පත්කරගෙන ඇත. වික්ටෝරියා පාර්ලිමේන්තුවේ මත්ද්‍රව්‍ය හා අපරාධ නිවාරණ කමිටු වාර්තාව, 2004 මඟින් පෙන්වාදෙන ආකාරයට සමාජශාලා වලට සහභාගී වී මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් ඉහළ වශයෙන් සමාජශීලීත්වය ළඟාකර ගැනීම සඳහා එම මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබයි.

වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගල කණ්ඩායම් වලට සාපේක්ෂවසමාජශාලාවල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සාමාන්‍ය සමාජයට නිරාවරණය හෝ දෘශ්‍ය නොවන නිසා ඔවුන් වෙනස් කණ්ඩායමක් ලෙස සැළකීම ආරම්භ කරයි. විශේෂයෙන්ම වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන

පුද්ගලකණ්ඩායම් සම්බන්ධයෙන් සමාජය විසින් ගොඩනගනු ලබන ලේබල්කරණයන් සහ ඍණාත්මක ප්‍රතිරූප හේතුවෙන් ඒ සම්බන්ධයෙන් සමාජය තුළඅවමානයට ලක්කරන හෝ බහිෂ්කරණයට ලක්කරන ස්වරූපයක් ඇත. නමුත් සමාජශාලාවල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් අදාළ අවකාශය තුළ සුරක්ෂිත පුද්ගල කොට්ඨාශයක් ය යන මිථ්‍යා විශ්වාසය තුළ ජීවත් වන අතර තමන් සම්බන්ධයෙන් එවැනි ඍණාත්මක ප්‍රතිචාරයක් හෝඅවමානයක් ගොඩනැගී නැති බවට ඔවුන් විශ්වාස කරයි. මෙය මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් අදාළ ඉලක්කගත කණ්ඩායම විසින් ගොඩනගා ගෙන ඇති සාවද්‍ය මතවාදයකි. නිවාරණ ක්‍රියාකාරකම්තුළ මේ සම්බන්ධයෙන් ඍජු අවධානයක් යොමුවීමේ අවශ්‍යතාව මේතුළ ඉස්මතු වී පෙනෙන කරුණකි.

එමෙන්ම අදාළ කණ්ඩායම තුළ එනම් රාත්‍රීසමාජශාලා සාදවල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් තුළ පවතින තවත් මිථ්‍යා විශ්වාසයක් නම් ඔවුන් ප්‍රතිකාර හෝ පුනරුත්ථාපනය සඳහා යොමුවීමේ අවශ්‍යතාවයක් නැති පුද්ගලයින් ලෙස සැළකීමයි. එනම් වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ පුද්ගලයින්ට සාපේක්ෂව ඔවුන් දැඩි ඇබ්බැහිකාරීත්වයෙන් පෙළෙන පුද්ගලයින් නොවන බවට සහ ඒ හේතුව නිසා අදාළ මත්ද්‍රව්‍ය භාවිත චර්යාව නැවැත්වීමට හෝ සුවවීම ඇති කර ගැනීමට අවශ්‍යතාවක් නොමැති බවයි. මෙම විශ්වාසය තුළ දීර්ඝකාලීන කටයුතු කිරීම හේතුවෙන් ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් ප්‍රතිකාර හෝ පුනරුත්ථාපන ක්‍රියාවලියට ඇතුළත් වීමට උත්සාහ නොකරන අතර එවැනි අවස්ථාවන් ප්‍රතික්ෂේප කරනු ලබයි.

එමෙන්ම ඇම්පිටමින් වර්ගයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් සිය මත්ද්‍රව්‍ය භාවිත චර්යාව පොදු අවකාශය තුළ සාකච්ඡා කරන හෝ අවධානයට ලක්වන සුවිශේෂී කරුණක් නැතිනම් ගැටලුවක් ලෙස දැකීමට අකැමැත්තක් දක්වන අතර එය තරුණ පුද්ගලයින් විසින් හුදෙක් විනෝදකාමී අංගයක් හෝ මිතුරු සමූහ තුළ සිදුවන එක් අවස්ථාවක් ලෙස සලකා සාමාන්‍යකරණය කරනු ලබයි. මේ සම්බන්ධයෙන් ද නිවාරණය තුළ අවධානය යොමු කළ යුතුය.

නිවාරණ ක්‍රියාකාරකම් වලට සමගාමීව විවිධ අධ්‍යාපනික වැඩසටහන් ඔස්සේ තරුණ පරම්පරාව උදෙසා මාර්ගෝපදේශයන් සැපයීම මෙවැනි සංසිද්ධීන් වල ඉස්මතු වීමත් සමඟ ජාතික අවශ්‍යතාවක් බවට පත්ව ඇත. විශේෂයෙන්ම සමාජශාලාවල මත්ද්‍රව්‍ය භාවිත කිරීම වටා ගොඩනැගී ඇති උප සංස්කෘතික ලාක්ෂණිකයන් සහ අංගයන් වලට පුද්ගලයින් ආකර්ෂණය වීම සිදුවෙයි. නූතන තාක්ෂණය හා සමාජ මාධ්‍යයවල ව්‍යාප්තියත් සමඟ ඒවා අවභාවිත කිරීම සිදුවන අතර සමාජ මාධ්‍යයහරහා තරුණ තරුණියින් විවිධ අපගාමී ක්‍රියාවන් උදෙසා සංවිධානගත කිරීම සිදුකරයි. රාත්‍රී සමාජශාලා සාද සහ ඒවායේ ඇති විශේෂාංග ප්‍රවර්ධනය කිරීමට සමාජ මාධ්‍ය භාවිත කරන අතර ඒ හරහා තරුණ පිරිස් ආකර්ෂණය කරගනු ලබයි. මෙම කරුණු සැළකිල්ලට ගනිමින් නූතන තාක්ෂණය අවභාවිත කිරීමෙන් වැළකීමේ සහ එවැනි අවදානම් සහගත තත්ත්ව හඳුනාගැනීම අරඹයා තරුණ පිරිස් සඳහා අධ්‍යාපනික වැඩසටහන් හඳුන්වා දීම අවශ්‍යතාවක් ලෙස ඉස්මතු වෙයි.

නිවාරණ ක්‍රියාකාරකම් හා ප්‍රතිකාර සේවාවන් මඟින් මෙම ක්ෂේත්‍රය නැතිනම් උප සංස්කෘතික කණ්ඩායම පිළිබඳව අවධානය යොමු කළයුතු අතරම නීතිය ක්‍රියාත්මක කිරීම මඟින් ද සැළකියයුතු පාලනයක් අපේක්ෂා කළ හැකිය. පුද්ගලයින් විවේකය ගත කිරීම සඳහා හෝ විනෝදාස්වාදය සඳහා

නිරතුරුවම සමාජ අනුමත විධික්‍රම තෝරා ගැනීමට සහ ඉන් පරිබාහිර නීත්‍යානුකූල නොවන මාර්ග වලට ඇති ඉඩප්‍රස්ථා අහිමි කිරීම වැදගත් වේ.

විශේෂයෙන්ම අන්තර්ජාලය භාවිත කරමින් සිදුකරන මත්ද්‍රව්‍ය ජාවාරම හා සාමාන්‍ය පොදු අවකාශයට නිරාවරණය නොවූ සමාජශාලා වැනි ස්ථාන ආශ්‍රිතව සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධයෙන් තවදුරටත් නෛතික මැදිහත්වීමක් අවශ්‍ය වන බව අධ්‍යයන අනාවරණයන් සාකච්ඡාවට භාජනය කිරීමේ දී තහවුරු වෙයි.

**නිගමන**

- වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ට සාපේක්ෂව සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් (club drug users)පුළුල් පරාසයකට ගැනෙන මත්ද්‍රව්‍ය හා මද්‍යසාර වර්ග භාවිත කරන අතර ඔවුන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් (poly drug users) වේ.
- LSD, Ecstasy ඇතුළු ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය, මෙතම්පිටමින් කාණ්ඩයට අයත් ද්‍රව්‍ය, වලට අමතරව හෙරොයින්, ගංජා සහ මද්‍යසාර  වැනි මත්ද්‍රව්‍ය හා මත්පැන් වර්ගයන් ද රාත්‍රී සමාජශාලා සාද ආශ්‍රිතව බහුලව භාවිත කරනු ලබයි.
- සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් එවැනි අවකාශයන් වල මෙන්ම ඉන් පරිබාහිර වෙනත් ස්ථාන වලදී ද එවැනි ද්‍රව්‍ය වර්ග භාවිත කිරීම සිදුකරයි.
- තරුණ පිරිස් සමාජශාලා සාදවලට යොමුවීම තුළින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ ප්‍රවණතාවයක් හඳුනාගත හැකි අතර තරුණ වයසේ පුද්ගලයින් අතර රාත්‍රී සමාජශාලා හෝ වෙරළ සාද ආශ්‍රිතව මත්ද්‍රව්‍ය භාවිත කිරීම සම්බන්ධයෙන් ඉහළ ප්‍රවණතාවක් හඳුනාගත හැකිය.
- රාත්‍රී සමාජශාලා සාද සහ ඒ ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා facebookවැනි සමාජ මාධ්‍ය භාවිත කරනු ලබයි.
- සමාජශාලා මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් වෙනම උප සංස්කෘතික කණ්ඩායමක්, සාමාන්‍ය සමාජයට නිරාවරණය නොවන අවකාශයක් තුළ සිටින පිරිසක් වීම හේතුවෙන් ඔවුන් වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගෙන් වෙනස්ව දැකීමට ප්‍රිය කරන අතරම ඒ හේතුව නිසා ඔවුන් ප්‍රතිකාර ලබා ගතයුතු හෝ ඇබ්බැහිකාරීත්වයෙන් පෙළෙන පිරිසක් ලෙස ඔවුන් නොදකියි. ඒ සමඟ ඔවුන්ගේ චර්යාවන් සාමාන්‍යකරණය කරගැනීමත් සිදුකරනු ලබයි.
- වීදි මට්ටමේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සම්බන්ධයෙන් සමාජය තුළ ගොඩනැගී ඇති සමාජ අවමානය, සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සම්බන්ධයෙන් ආරෝපණය වී නොමැත. එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ ඔවුන්ගේ චර්යාවන් පොදු අවකාශයට නිරාවරණය නොවීමයි.

- සමාජශාලා සාද වලට සහභාගී වී මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් දැඩි ලෙස වැරදි සහගත විශ්වාස හෝ තීරණයන් මත ක්‍රියාත්මක වෙයි. එමෙන්ම ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සාධාරණීකරණය කරගැනීම උදෙසා සමාජශාලා ආශ්‍රිතව සිදුවන විවිධ විශේෂාංග භාවිත කරයි.
    - උදා -: නර්තනයේ යෙදීම සඳහා මත්ද්‍රව්‍ය ගැනීම.

- සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිතයට පුද්ගලයින් යොමුවීම කෙරෙහි විවිධ ආකර්ෂණීය සාධක බලපාන අතර, එවැනි අවකාශ වල පවතින විනෝදාස්වාදය අරමුණු කරගත් විශේෂාංග සහ සමාජ මාධ්‍ය මඟින් ඒ සම්බන්ධයෙන් කරනු ලබන ප්‍රවර්ධනය එම ආකර්ෂණීය සාධක අතර ප්‍රබල වේ.
- නාගරික හා උප නාගරික ප්‍රදේශ ආශ්‍රිතව සහ වෙරළාසන්න ප්‍රදේශවල හා ඒවායේ පැවැත්වෙන සාද වලට වෙනත් නාගරික, උපනාගරික හා ග්‍රාමීය ප්‍රදේශ වලින් ද පුද්ගලයින් සහභාගී වන අතර ඔවුන් විවිධ ස්ථානවල පැවැත්වෙන සාද වලට සහභාගී වීමේදී ඔවුන් අතර සබඳතා ජාලයක් නිර්මාණය කරගනු ලබයි. මේ තුළ මෙම ප්‍රවණතාව සෑම ප්‍රදේශයකටම ව්‍යාප්ත වීමේ අවධානමක් ඇත.
- සමාජශාලා වැනි පරිශ්‍ර වලට මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම සම්බන්ධයෙන් වෙනම පුද්ගලයින් පිරිසක් නියැලී සිටින අතර මිතුරු කණ්ඩායම් තුළ විවිධ මත්ද්‍රව්‍ය සංසරණය කරගැනීම සිදුකරයි.

**යෝජනා**

- නිවාරණ ක්‍රියාකාරකම් මගින් ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය අවභාවිත කරන පුද්ගලයින් ඉලක්ක කළයුතු අතර එහිදී ඔවුන් විසින් ගොඩනගාගෙන ඇති සාමාන්‍යකරණයන් හා මිථ්‍යා විශ්වාසයන් පිළිබඳ අවධානය යොමුකළ යුතු අතර නිවැරදි අවබෝධය ලබාදිය යුතුය.

- තවදුරටත් නිවාරණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී තරුණ ජනහනයට වඩාත් ප්‍රවේශ වියහැකි සමාජ මාධ්‍ය වැනි මාර්ග භාවිත කිරීම වැදගත් වේ. ඊට අමතරව සමාජශාලා සාද වල වැඩි ව්‍යාප්තියක් සහිත ප්‍රදේශ වල තරුණ පිරිස් උදෙසා අවිධිමත් නිවාරණ ක්‍රියාකාරකම් මගින් ඒවාට සහභාගී නොවීම සම්බන්ධයෙන් පෙළඹවීමක් ඇති කිරීම වැදගත් වේ.
- අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හරහා නූතන සන්නිවේදන තාක්ෂණය නිවැරදිව භාවිත කිරීමට සහ නූතන තාක්ෂණය හා සම්බන්ධ අවදානම් සහගත ප්‍රවණතා හඳුනාගැනීමට තරුණ පිරිස් තුළ කුසලතා වර්ධනය කිරීම වැදගත් වේ.
- ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය දීර්ඝකාලීනව භාවිත කිරීමට යොමුවී සිටින පුද්ගලයින් උදෙසා ඇබ්බැහිකාරීත්වයෙන් මිදීම සඳහා ප්‍රතිකාර වලට යොමුකිරීම කෙරෙහි අවධානය යොමු කළයුතු අතර රාජ්‍ය හා රාජ්‍ය නොවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල සමාජශාලා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් සඳහා ප්‍රතිකාර වැඩසටහන් සැළසුම් කළ යුතුය. එමෙන්ම අදාළ පුද්ගලයින් සඳහා පූර්ව පියවරක් වශයෙන් ප්‍රජාව තුළ පුද්ගලික උපදේශනය වැනි ප්‍රවේශ ඵලදායී විය හැකිය.
- ඇම්පිටමින් වර්ගයේ ද්‍රව්‍ය ජාවාරම් කිරීම වැළැක්වීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන අංශ වල සුවිශේෂී අවධානය යොමුවිය යුතු අතර අන්තර්ජාලය භාවිත කරමින් සිදුවන ජාවාරම් හා මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම පිළිබඳව සැලකිලිමත් වීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව ඇත.
- වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන ඖෂධ වර්ග අවභාවිත කිරීමේ ප්‍රවණතාව සම්බන්ධයෙන් නෛතික හා ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුළ අවධානය යොමු කළ යුතුය.
- “Party drug use”සම්බන්ධයෙන් සහයෝගීත්ව ප්‍රවේශයකින් කටයුතු කළ යුතු අතර එහිදී පොලිසිය, ගුරු වෘත්තිකයින්, වෛද්‍ය වෘත්තිකයින්, උපදේශකයින් සහ පර්යේෂකයින් මෙන්ම ප්‍රජා සංවිධාන වැනි අංශ මගින් වැදගත් භූමිකාවක් ඉටුකළ යුතුය. එනම් නීතිය ක්‍රියාත්මක කිරීම, දැනුවත් කිරීම (නිවාරණය) සහ ප්‍රතිකාර වලට යොමු කිරීම යන ප්‍රවේශ වලින් සමබරව මෙම ගැටලුව ආමන්ත්‍රණය කිරීම වැදගත් වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


Calafat Far, A. *et al.* (1999) 'Night life in Europe and recreative drug use . SONAR 98', *Europe*, p. 242.

Gureje, O. (2007) 'Alcohol, Gender and Drinking Problems: Perspectives from Low and Middle Income Countries. Edited by Isidore S. Obot & Robin Room. World Health Organization.

Van Havere, T. *et al.* (2009) 'The influence of age and gender on party drug use among young adults attending dance events, clubs, and rock festivals in Belgium', *Substance Use and Misuse*, 44(13), pp. 1899–1915. doi: 10.3109/10826080902961393.

Lam, C., Sub-committee, H. K. A. C. A. N. R. and Administration, U. of H. K. D. of S. W. & S. (2004) 'A study of substance abuse in underground rave culture and other related settings', (September), pp. 84–104.

National Dangerous Drugs Control board (2017) *Handbook of Drug Abuse information in Sri Lanka 2017*. rajagiriya: National Dangerous Drugs Control board.

NHS (2012) 'Club Drugs: Emerging Trends and Risks', pp. 1–8. Available at: www.nta.nhs.uk/uploads/clubdrugsreport2012[0].pdf.

Report, F. (no date) *Inquiry into Amphetamine and ' Party Drug ' Use in Victoria DRUGS AND CRIME PREVENTION COMMITTEE*.

UNODC (2015) 'Amphetamine - Type Stimulants ( ATS )', p. 111.

Use, M. (no date) 'Meth ( Crank , Ice ) Facts Signs of Meth Use and Addiction', (January 2017), pp. 1–2.

Winstock, A. R., Griffiths, P. and Stewart, D. (2001) 'Drugs and the dance music scene: A survey of current drug use patterns among a sample of dance music enthusiasts in the UK',